පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

# කාර්ය සාධන වාර්තාව
# 2016

# පටුන


හැඳින්වීම 1

1. පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ දැක්ම 2

2. පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මෙහෙවර 2

3. අමාත්‍යාංශයේ විෂයන් හා කාර්යයන් 3

4. අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති හා උපාය මාර්ග 4

5. අමාත්‍යාංශයට අයත් අංශ හා ආයතන 5

6. කාර්ය සාධන සාරාංශ -2016 6

6.1. මූල්‍ය සාරාංශය 6

6.2. භෞතික කාර්යසාධනය සැකෙවින් 7

6.3. අමාත්‍යාංශයේ අංශ හා ආයතන වල කාර්ය සාධනය 10

6.3.1. පළාත් පාලන අංශය 10

6.3.2. පළාත් සභා අංශය 15

6.3.3. සංවර්ධන අංශය 17

6.3.4 නීති අංශය 59

6.3.5. පාලන අංශය 62

6.3.6. වියදම් විමංශන අංශය 63

6.3.7. අභ්‍යන්තර විගණන අංශය 66

6.3.8. ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය 67

6.3.9. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය 71

6.3.10. දේශීය ණය හා සංවර්ධන අරමුදල 79

# හැඳින්වීම

රටක මහජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සෑම රටකම ප්‍රමුඛතම ඉලක්කයක් මෙන්ම අවශ්‍යතාවයකි. ශ්‍රී ලංකාව ද උත්සහ කරන්නේ ආර්ථිකමය , සමාජීය හා සංස්කෘතික වශයෙන් දියුණු සංවර්ධිත මට්ටමක් කරා ගමන් කර මහජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමයි. මේ ක්‍රියාවලියේ දී ප්‍රාදේශීය මට්ටමෙන් හා පළාත් මට්ටමින් පවතින අසමතා අවම කිරීමටත් ජාතික ආර්ථික සංවර්ධනයට දායකත්වය ලබාදීමටත් රටේ ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාවලිය වැඩි දුරට ශක්තිමත් කිරීමටත් ප්‍රශස්ත සේවාවක් මෙරට ක්‍රියාත්මක පළාත් සභා හා පළාත් පාලන පද්ධතියෙන් ඉෂ්ට වී තිබේ.

මෙම තත්ත්වය තුල පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය පසුගාමී පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදීම මගින් ඒවායේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා අවශ්‍ය යන්ත්‍රෝපකරණ ලබා දීම සඳහා  කටයුතු කර ඇත.විශේෂයෙන් දෛනික කටයුතු පවත්වාගෙන යාමට ප්‍රමාණවත් ආදායම් තත්වයක් නොමැතිකම නිසා බොහෝ ප්‍රාදේශීය සභාවලට විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවන බැවින් එවැනි ප්‍රාදේශීය සභා තෝරාගෙන ඒවායෙහි අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු සඳහා ද මුදල් ප්‍රතිපාදන ලබා දී ඇත.

වර්තමානයේ මුළු මහත් ලෝකයටම අභියෝගයක් වී පවතින ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කොට ඒ සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරීමට මෙම අමාත්‍යාංශය විසින් කටයුතු කරනු ලැබේ. මෙහි මූලික පියවරයක් වශයෙන් අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා සෙසු පහසුකම් පළාත් පාලන ආයතන වෙත ලබාදීමට කටයුතු කර තිබේ. තවද, ඩෙංගු මර්ධනය සඳහා ද අවශ්‍ය කරන සහය ලබා දී ඇත. පළාත් සභා සහ පලාත් පාලන ආයතන පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් කටයුතු සඳහා මූලිකත්වය ලබාදී ඇති අතර මේ වන විට මෙම ක්ෂේත්‍රය මුහුණ දි තිබෙන යටිතල පහසුකම් සංවර්ධනය, මානව සම්පත් සංවර්ධනය හා හා සමාජ ආර්ථික දේහය තුල මුහුණ දෙන ගැටලු වලදී අන්තර්ජාතික ආයතන හරහා ලබා දෙන සම්පත් කාර්යක්ෂම යෙදවීම් සඳහා වන ප්‍රමුඛ කාර්යභාරය 2016 වසරේ දී සාර්ථකව ඉටුකිරීමට හැකි විය.

දියුණු ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යක් නිර්මාණය වීමට නම් ප්‍රශස්ත ප්‍රාදේශීය පාලන ව්‍යුහයක් ස්ථාපනය කිරීම අත්‍යාවශ්‍යය. ඒ සඳහා පළාත් සභා හා පලාත් පාලන ආයතන ක්‍රමයෙහි පවත්නා ප්‍රශස්ත තත්ත්වයන් මෙන්ම දුර්වල තත්ත්වයන්ද හඳුනාගත යුතු ය. ලෝකයේ ඇතැම් රට වල දියුණු පළාත් පාලන ආයතන විසින් ලගා කරගෙන ඇති ඉහළ කාර්ය්‍ය සාධන දර්ශක වලට ලගා විය හැකි ක්‍රියාමාර්ග වලට එළඹෙමින් ඉදිරි අවුරුදු පහ ඇතුළත මෙරට පළාත් පාලන ආයතන පද්ධතිය සමස්තයක් වශයෙන් ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමද මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණකි.

රජයේ යහපාලන මූලධර්මයන්ට අනුගත වෙමින් ඒවා ආරක්ෂා කරමින් හා සංවර්ධනය කරමින් ඉදිරියට යන ජනතා නියෝජිතයන්, රාජ්‍ය සේවකයන් සහ සිවිල් සමාජය යන අංශයන් විධිමත්ව කළමනාකරණය කිරිමේ පරිපාලන රාමුවක අවශ්‍යතාව මෙන්ම විශේෂයෙන් ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති සැලසුම්කරණය, අයවැයකරණය, ක්‍රියාත්මකකිරීම, පසුවිපරම් හා භාරකාරීත්වය යන කාර්යයන්හී දී ප්‍රජා සහභාගීත්වය වර්ධනය කිරීම කෙරෙහි ද මෙම අමාත්‍යාංශයේ අවධානය යොමු වී තිබේ.

විශේෂයෙන්ම පළාත් පාලන ආයතන පනත වර්තමානයට ගැළපෙන පරිදි යාවත්කාලීන කිරීම, පලාත් පාලන ආයතන සංස්ථාපනය කිරීම හා පවත්නා පළාත් පාලන ආයතන උසස්කිරීම සඳහා ජාතික නිර්ණායක පද්ධතියක් සකස් කිරීම, පළාත් පාලන කොට්ඨාශ සීමා නිර්ණ අභියාචනා විමර්ශණ කමිටුව මගින් සුදුසු පරිදි කොට්ඨාශ, මායිම්, නම් අංක හෝ අක්ෂර සංශෝධනය කිරිම වැනි සුවිශේෂී වූ ප්‍රතිපත්තිමය කරුණු මෙම අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් සිදුකර ඇත.

ඒ සමගම නව පරිගණක තාක්ෂණික ක්‍රමවේද යොදා ගනිමින් දැනට අත්හදා බලා ඇති පෙරටු කාර්යාල ක්‍රමය සියලුම පළාත් පාලන ආයතනවලට හඳුන්වා දීම සහ ජාතික ආර්ථිකය තුළ පළාත් සභා සහ පලාත් පාලන ආයතන වගකිවයුතු කාර්ය්‍ය භාරයක් ඉටු කරන ව්‍යුහයක් නිර්මාණය කිරිම සඳහා අවශ්‍ය කරන ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ශක්‍යතාව ඇති ව්‍යාපෘති සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමේ ඉලක්කගත වැඩපිළිවෙල හඳුන්වාදීම ද අමාත්‍යාංශයේ ඉදිරි සැලැස්මෙහි ප්‍රධාන අංගයකි.

# 1. දැක්ම

කාර්යක්ෂම, සහයෝගීත්ව, නව්‍ය මෙන් ම ජනතාවට වගකියන උසස් හා ගුණාත්මක ප්‍රජා සේවාවන් සපයන පළාත් සභා සහ පළාත් පාලන ක්‍රමයක් ඇති කිරීම.

# 2. මෙහෙවර

- ✓ පළාත් සභා සහ පළාත් පාලන ක්‍රමය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති හා නීති සම්පාදනය කිරීම
- ✓ පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට ඒවායේ බලතල භාවිතයෙන් සේවාවන් සැපයීම සඳහා ඒවායේ ශක්‍යතාව ඉහළ නැංවීම
- ✓ පළාත් සභා සහ පළාත් පාලන ක්‍රමය තුළ පිළිබිඹු වන ජනතා අභිලාෂය තහවුරු කිරීම
- ✓ පළාත් සභා, පළාත් පාලන ආයතන හා වෙනත් ආයතන සමග සම්බන්ධතා පවත්වමින් සියලු ප්‍රජා-වන්ගේ අභිවෘද්ධිය උදෙසා කටයුතු කිරීම

# 3. විෂයයන් හා කාර්යයන්

2015-09-30 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද නව අමාත්‍යාංශවල විෂයයන් හා කාර්යයන් පිළිබඳ නිවේදනයට අනුව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ විෂයයන් හා කාර්යයන්

- පළාත් සභා සහ පළාත් පාලන විෂයයන්ට සහ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය හා දේශීය ණය සංවර්ධන අරමුදල යන ආයතනයන්හි අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම හා අගැයීම
- පළාත් සභාවලට අදාළ කටයුතු නියාමනය කිරීම
- පළාත් සභාවල මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා සේවකයන් පුහුණු කිරීම
- පළාත් පාලන ආයතනවලට අදාළ රජයේ කර්තව්‍යයන්
- පොදු පහසුකම් සංවර්ධනය සඳහා පළාත් පාලන ආයතනවලට ණය පහසුකම් ලබාදීම
- පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා සේවකයන් පුහුණු කිරීම
- පළාත් සභා සහ පළාත් පාලන ආයතන පරිපාලනයෙහි සෑම මානයක් සම්බන්ධයෙන් ම පර්යේෂණ පැවැත්වීම
- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය හා දේශීය ණය සංවර්ධන අරමුදල යන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලු ම විෂය කටයුතු
- පූර්වෝක්ත ආයතනයන් අධීක්ෂණය කිරීම

# 4. ප්‍රතිපත්ති සහ උපාය මාර්ග

ප්‍රතිපත්තිය

පළාත්වල ස්වයං තිරසරභාවය තහවුරු කරමින් අන්තර් අසමානතා අඩු කිරීම හා දළ දේශීය නිෂ්පාදිතයට පළාත්වලින් සැපයෙන දායකත්වය වර්ධනය කිරීම.

උපාය මාර්ග

1. යහපාලන මූලධර්ම පිළිපදිමින් එක් එක් පළාතේ පවත්නා මානව ප්‍රාග්ධනය හා පාරිසරික සම්පත් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගනිමින් සෑම පළාතක ම ආදායම් උත්පාදන හැකියාව වර්ධනය කිරීම.

2. සංක්‍රමණ අනුපාතයට සාපේක්ෂව ඉහළ මට්ටමක පවතින පළාත්වල එම මට්ටම අවම කිරීම සඳහා වඩාත් යෝග්‍ය ප්‍රතිපත්ති හා දීර්ඝකාලීන වැඩසටහන් සම්පාදනය කිරීම සහ හඳුන්වාදීම.

3. රටේ සමස්ත සමාජ-ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයට දායකවීම සඳහා එක් එක් පළාතේ පවත්නා මානව සම්පත උපයෝගී කරගැනීම තහවුරු කිරීම.

4. බිම් මට්ටමේ ප්‍රජා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ප්‍රජා සහභාගීත්වය වර්ධනය කිරීම මගින් පළාත්වල පවතින සම්පත් සජීවීකරණය කිරීම සහ ග්‍රාමීය ප්‍රජාවගේ අගයයන් හා ශක්‍යතාවන් බලාත්මක කිරීම.

5. එක් එක් පළාතේ පවතින ස්වාභාවික සම්පත්වල තිරසර භාවිතය සහතික කරන අතරේ, ආපදා අවදානම් අවම කිරීමේ හා ආපදා අවස්ථාවලට මුහුණ දීමේ ක්‍රියාමාර්ගයන් ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන ක්‍රියාකාරකම්වලට ඒකාබද්ධ කිරීම.

6. මානව සම්පත් සංවර්ධනය සහ විද්‍යාත්මක පදනමක් මත පළාත් පාලන ආයතන උත්ශ්‍රේණිගත කිරීම මගින් ඵලදායී හා කාර්යක්ෂම පළාත් සභා සහ පළාත් පාලන පරිපාලන ක්‍රමයක් සහතික කිරීම.

# 5. අමාත්‍යාංශයට අයත් අංශ හා ආයතන

1. පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගේ කාර්යාලය
2. පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමාගේ කාර්යාලය
3. අමාත්‍යාංශ ලේකම් කාර්යාලය
4. පළාත් පාලන අංශය

   2016 වර්ෂයේ අමාත්‍යමණ්ඩලය පත්‍රිකා හරහා ක්‍රියාත්මක කල ප්‍රතිපත්ති තීරණ

   I. පළාත් පාලන ප්‍රතිසංස්කරණ ඒකකය

   II. පැමිණිලි හා තොරතුරු ඒකකය

   III. තොරතුරු තාක්ෂණ ඒකකය
5. පළාත් සභා අංශය
6. සංවර්ධන හා සැලසුම් අංශය
7. පාලන අංශය
8. නීති අංශය
9. මුදල් අංශය
10. වියදම් විමංසන අංශය
11. අභ්‍යන්තර විගණන අංශය
12. ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය

    I. ඩෙංගු මර්ධන ඒකකය
13. මාධ්‍ය ඒකකය
14. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
15. දේශීය ණය සංවර්ධන අරමුදල

# 6. කාර්යසාධන සාරාංශ -2016

## 6.1. මූල්‍ය සාරාංශය

*වගු අංක 1- මූල්‍ය සාරාංශය*

| වැඩසටහන | **2016** සඳහා ඇස්තමේන්තුව (රු.) | **2016.12.31** දිනට වියදම (රු.) |
|---|---|---|
| ***පුනරාවර්තන වියදම්*** | | |
| පුද්ගල පඩිනඩි | 146,804,000 | 140,298,689 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 2,117,779,000 | 989,605,650 |
| එකතුව | **2,264,583,000** | **1,129,904,339** |
| ***ප්‍රාග්ධන වියදම්*** | | |
| **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | **17,500,000** | **16,260462** |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 12,500,000 | 12,044,886 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,000,000 | 607,074 |
| වාහන | 4,000,000 | 3,608,502 |
| **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | **83,783,902** | **40,189,949** |
| වාහන | 78,783,902 | 35,783,902 |
| ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 3,000,000 | 3,000,000 |
| යන්ත්‍ර, ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2,000,000 | 1,406,047 |
| වෙනත් ප්‍රාග්ධන වියදම් | 4,341,020,000 | 4,172,449,935 |
| දේශීය ආධාර ලබන ව්‍යාපෘති | 1,194,310,000 | 533,607,696 |
| විදේශීය ආධාර ලබන ව්‍යාපෘති | 32,059,316,000 | 28,430,685,007 |
| එකතුව | **37,594,646,000** | **33,136,742,639** |
| මුළු එකතුව | **39,960,512,902** | **34,323,097,389** |

මූලාශ්‍රය: මූල්‍ය අංශය

2016.12.31 දිනට අමාත්‍යාංශ සමස්ථ මූල්‍ය ප්‍රගතිය 87%

# 6.2. භෞතික කාර්යසාධනය සැකෙවින්

| | සංවර්ධන කාර්යය/ ක්ෂේත්‍රය | කාර්ය නිමැවුම |
|---|---|---|
| **පළාත් / ග්‍රාමීය මාර්ග සහ පාලම් සංවර්ධනය** | | |
| 01 | සංවර්ධනය කළ පළාත් මාර්ගවල දුර ප්‍රමාණය | කි.මී. 253 |
| 02 | ඉදිකරන ලද සහ ප්‍රතිසංස්කරණය කරන ලද ග්‍රාමීය මාර්ග සංඛ්‍යාව (තාර, කොන්ක්‍රීට්,බොරළු) | 1835 |
| | ග්‍රාමීය මාර්ග යටතේ ඉදිකරන ලද පාලම් / බෝක්කු සංඛ්‍යාව | 114 |
| | ග්‍රාමීය මාර්ග යටතේ ඉදිකරන ලද පැති බැම් සංඛ්‍යාව | 76 |
| 03 | ඉදි කරන ලද ග්‍රාමීය පාලම් සංඛ්‍යාව (මී. 6 සිට මී. 30 දක්වා) | 528 |
| **වාරිමාර්ග සංවර්ධනය (ඉරණමඩු - කිළිනොච්චි)** | | |
| 01 | වැඩ නිම කරන ලද ප්‍රධාන වාරි ඇළ මාර්ගවල දුර ප්‍රමාණය | කි.මී. 255 |
| 02 | වැඩ නිම කරන ලද අනෙකුත් වාරි ඇළ මාර්ගවල දුර ප්‍රමාණය | කි.මී. 135 |
| 03 | වාරි ඇළ මාර්ග හරහා ඉදිකරන ලද පාලම් / බෝක්කු සංඛ්‍යාව | 210 |
| 04 | ඉරණමඩු ජලාශයේ ප්‍රධාන වේල්ල උස් කොට ඉදිකිරීම හා අලුත්වැඩියා කටයුතු | 50% වැඩ අවසන් |
| 05 | ඉරණමඩු ජලාශයේ වාන් දොරටු සහ පිට වාන පුනරුත්තාපනය කිරීම | |
| 06 | ඉරණමඩු ජලාශයේ දිය රැළි ආරක්ෂිතයන් (ඍසච ඍ්ච ජරදඑැජඑසදබ) ඉදිකිරීම | |
| 07 | ඉරණමඩු උත්සාන වාරිමාර්ග යෝජනා ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම | |
| **අපජල පවාහන පද්ධති පුනරුත්ථාපනය (කොළඹ මහ නගර සභා බලප්‍රදේශය)** | | |
| 01 | මුහුදට අපජලය මුදා හරින ප්‍රධාන නල මාර්ග 02 (වැල්ලවත්ත සහ මුතුවැල්ල) ප්‍රතිසංස්කරණය කිරීම | 100% |
| 02 | අපජල නල එලීම අවසන් කරන ලද දුර ප්‍රමාණය(කොළඹ සීවලී මාවත හා සරණපාලහිමි මාවත) | මී. 662 |
| 03 | අපජල නල පද්ධතිය පිරිසිදු කිරීම සහ අපජල පවාහන පද්ධතියේ තත්ත්ව සමීක්ෂණය ක්‍ක්‍ඍ මගින් අවසන් කරන ලද දුර ප්‍රමාණය | කි.මී. 105 |
| **පළාත් පාලන ආයතන යටිතල පහසුකම් සංවර්ධනය** | | |
| 01 | ඉදිකරන ලද / සංවර්ධනය කරන ලද සතිපොළ සංඛ්‍යාව | 154 |
| 02 | ඉදිකරන ලද / සංවර්ධනය කරන ලද වෙළඳ මධ්‍යස්ථාන සංඛ්‍යාව | 24 |
| 03 | ඉදිකරන ලද / සංවර්ධනය කරන ලද සංචාරක ආකර්ෂණීය ස්ථාන සංඛ්‍යාව | 10 |
| 04 | ඉදිකරන ලද බස්නැතුම්පොල / වාහන නැවතුම්පොළ සංඛ්‍යාව | 17 |
| 05 | ඉදිකරන ලද පුස්තකාල සංඛ්‍යාව | 72 |
| 06 | ඉදිකරන ලද ආයුර්වේද හා සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව | 44 |
| 07 | ඉදිකරන ලද පහසු මධ්‍යස්ථාන සහ පොදු වැසිකිළි සංඛ්‍යාව | 124 |
| 08 | ඉදිකරන ලද දිවාසුරැකුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව | 16 |
| 09 | ඉදිකරන ලද පොදු ගොඩනැගිලි සංඛ්‍යාව | 103 |
| 10 | ඉදිකරන ලද ජල ව්‍යාපෘති සංඛ්‍යාව | 63 |
| 11 | ඉදිකරන ලද අදාහනාගාර සංඛ්‍යාව | 01 |
| 12 | ඉදිකරන ලද උද්‍යාන / ක්‍රීඩාංගන සංඛ්‍යාව | 43 |
| 13 | ඉදිකරන ලද සංස්කෘතික මධ්‍යස්ථාන සංඛ්‍යාව | 04 |
| 14 | ඉදිකරන ලද කාර්යාල ගොඩනැගිලි සංඛ්‍යාව | 04 |
| 15 | ඉදිකරන ලද කාණු පද්ධති සංඛ්‍යාව | 218 |

| | | |
|---|---|---|
| 16 | ස්ථාපිත කරන ලද පෙරටු කාර්යාල සංඛ්‍යාව(පළාත් පාලන ආයතන 108ක්තුළ) | 108 |
| **අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධනය** | | |
| 01 | ඉදිකරන ලද / අලුත්වැඩියා කරනලද පන්ති කාමර ගොඩනැගිලි සංඛ්‍යාව | 270 |
| 02 | ඉදිකරන ලද / අලුත්වැඩියා කරනලද කලාප අධ්‍යාපන කාර්යාල ගොඩනැගිලි සංඛ්‍යාව | 26 |
| 03 | ඉදිකරන ලද / අලුත්වැඩියා කරනලද කොට්ඨාස අධ්‍යාපන කාර්යාල ගොඩනැගිලි සංඛ්‍යාව | 43 |
| 04 | පාසල් සඳහා බෙදා දෙන ලද පරිගණක සහ උපාංග (ඔෆී, ස්කැනර්, ප්‍රින්ටර් ආදිය) සංඛ්‍යාව | 4758 |
| 05 | පාසල් පන්ති කාමර සඳහා බෙදා දෙන ලද මේස / පුටු සංඛ්‍යාව | 56318 |
| 06 | පාසල් සහ අධ්‍යාපන කාර්යාල සඳහා බෙදා දෙන ලද කාර්යාල ගෘහ භාණ්ඩ (මේස, පුටු, කබඩ් ආදි) සංඛ්‍යාව | 8366 |
| 07 | පළාත් අධ්‍යාපන ආයතන සහ කලාප / කොට්ඨාස අධ්‍යාපන කාර්යාල සඳහා බෙදා දෙන ලද වාහන සංඛ්‍යාව | 20 |
| 08 | පාසල් හා අධ්‍යාපන කාර්යාල සඳහා බෙදා දෙන ලද අනෙකුත් කාර්යාල උපකරණ (ෆැක්ස් යන්ත්‍ර, ඡායාපිටපත් යන්ත්‍ර, මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර්ස්, කැමරා ආදී) සංඛ්‍යාව | 782 |
| 09 | පාසල් සඳහා බෙදා දෙන ලද ක්‍රීඩා උපකරණ සහ විද්‍යාගාර / ගෘහ විද්‍යාගාර සඳහා බෙදා දෙන ලද උපකරණ සංඛ්‍යාව | 290495 |
| **සෞඛ්‍ය ක්ෂේත්‍ර සංවර්ධනය** | | |
| 01 | පරිගණකගත දත්ත පද්ධතියක් ඇති කිරීම | 205 |
| 02 | රෝහල්වල හදිසි ප්‍රතිකාර ඒකක පිහිටුවීම හා දැනට තිබෙන හදිසි ප්‍රතිකාර ඒකක වැඩිදියුණු කිරීම. | 196 |
| 03 | මාතෘ හදිසි ප්‍රතිකාර ඒකක වැඩිදියුණු කිරීම. | 83 |
| 04 | ජනතාව සඳහා දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | 9996 |
| 05 | වෛද්‍ය උපකරණ හා වෙනත් අත්‍යාවශ්‍ය උපකරණ මිලදී ගැනීම. | 89670 |
| 06 | වෛද්‍ය සායන පැවැත්වීම. | 1892 |
| 07 | ඖෂධ ගබඩා අළුත්වැඩියා කිරීම සහ ඖෂධ සැපයීම | 492 |
| **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කිරීම** | | |
| 01 | ඉදිකරන ලද කොම්පෝස්ට් අංගන සංඛ්‍යාව | 10 |
| 02 | පළාත් පාලන ආයතන සඳහා බෙදා දෙන ලද බොබ් කැට් (ඊදඉ ඦ) යන්ත්‍ර සංඛ්‍යාව | 09 |
| 03 | පළාත් පාලන ආයතන සඳහා බෙදා දෙන ලද ගෘහස්ථ කොම්පෝස්ට් බඳුන් සංඛ්‍යාව | 7200 |
| **හදිසි ආපදා ප්‍රතිචාර ජාලය ශක්තිමත් කිරීම** | | |
| 01 | පළාත් පාලන ආයතන වෙත බෙදා දෙන ලද ගිනි සහ මුදවා ගැනීම් රථ (Fire Fighting Water Tender) සංඛ්‍යාව (මාතලේ මහ නගර සභාව සහ වවුනියාව නගර සභාව) | 02 |
| 02 | පළාත් පාලන ආයතන වෙත බෙදා දෙන ලද ගිලන් රථ සංඛ්‍යාව(කොළඹ, මාතලේ සහ යාපනය ම.න.සභා සහ වවුනියාව, අම්පාර නගර සභා) | 05 |
| 03 | ගිනි නිවීම් ඒකක ගොඩනැගිලි අලුත්වැඩියාව (යාපනය ම.න.ස) | 1% |
| **පළාත් සභා සහ පළාත් පාලන ආයතන නීති පද්ධති ප්‍රතිසංස්කරණය** | | |
| 01 | පළාත් පාලනය සඳහා කාන්තා නියෝජනය 25% ක් සහතික කිරීම පිණිස අදාළ පනත පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීම | අවසන් |
| 02 | පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා ආචාර ධර්ම පද්ධතියක් (Code of Conduct)සකස් කිරීම | අවසන් |

| | | |
|---|---|---|
| 03 | නගර සභා, මහ නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා අණ පනත් සංශෝධනය සඳහා කමිටුවක් පත්කර එමගින් අදාළ සංශෝධනයන් සඳහා කාලීන යෝජනාවලියක් සකස් කිරීමට කටයුතු කිරීම | 70%ක් අවසන් |
| 04 | පළාත් පාලන ආයතන මැතිවරණ ආඥා පනත සංශෝධනය කිරීම | 90%ක් අවසන් |
| 05 | පළාත් සභා පනත සංශෝධනය කිරීම | 90%ක් අවසන් |
| 06 | වතු කම්කරුවන්ගේ සුබසාධනය සඳහා ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීමට අදාළ කටයුතු ක්‍රියාත්මක කිරීම. | 80%ක් අවසන් |
| 07 | උසාවි දඩ මුදල් සහ ඉඩම් පැවරීම මත අය වන මුද්දර ගාස්තු පළාත් පාලන ආයතන වෙත ලැබීම විධිමත් කිරීම හා කඩිනම් කිරීම සඳහා පළාත් සභා පනත සංශෝධනය කිරීම. | 50%ක් අවසන් |
| **ජාතික සීමා නිර්ණය කිරීමේ කමිටු කාර්යයන්** | | |
| 01 | ජාතික සීමා නිර්ණය කිරීමේ කමිටු වාර්තාව පදනම් කරගෙන ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍රය අනුව, කොට්ඨාශ මායිම්වල නිරවද්‍යතාවය සම්බන්ධයෙන් මහජනතාව විසින් යොමු කරන ලද පැමිණිලි / යෝජනා / අභියාචනා විමර්ශනය කිරීම සම්බන්ධයෙන් පත්කරන ලද පළාත් පාලන කොට්ඨාස සීමා නිර්ණ අභියාචනා විමර්ශන කමිටුවේ කාර්යයන් අවසන් කිරීම හා අවසන් වාර්තාව බාරදීම. | අදාළ කමිටු වාර්තාව 2017 ජනවාරි මස පළාත් සභා සහ පළාත් පාලන ගරු අමාත්‍යතුමා වෙත භාරදීමට නියමිතය. |
| **අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධනය** | | |
| 01 | විදේශීය ධාරිතා පුහුණු වැඩසටහන් සඳහා යොමු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව | 29 |
| 02 | දේශීය ධාරිතා පුහුණු වැඩසටහන් සඳහා යොමු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව | 123 |
| **පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින් / නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම (පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය)** | | |
| 01 | නිලධාරීන් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව (තාක්ෂණික නිලධාරීන්, වැඩ පරිපාලකවරුන් ඇතුළු අනෙකුත් තාක්ෂණික නොවන කාර්ය මණ්ඩලය) | 168 |
| **පළාත් පාලන ආයතන සඳහා සහනදායී කොන්දේසි මත ණය සැපයීම (දේශීය ණය සහ සංවර්ධන අරමුදල)** | | |
| 01 | පළාත් පාලන ආයතනවල සංවර්ධන ව්‍යාපෘති සඳහා සපයන ලද සහනදායී ණය ප්‍රමාණය | රු.මිලියන 144 |

# 6.3. අමාත්‍යාංශයේ අංශ හා ආයතනවල කාර්යසාධනය

## 6.3.1. පළාත් පාලන අංශය

**අරමුණ:**

ප්‍රාදේශීය සම්පත් හා ශක්තීන් ගොනුකර ප්‍රාදේශීය අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ස්වයං උත්පාදන ආයතනයන් බවට පත්වීමේ අභිලාශයෙන් සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීම සඳහා තමන් වෙත පැවරී ඇති කාර්යය හා බලතල සාර්ථකව ක්‍රියාත්මක කෙරෙන පළාත් පාලන ආයතන බිහිකිරීම සඳහා අවශ්‍ය ජාතික මට්ටමේ නියාමනය


**උපාය මාර්ග**


01. යහ පාලන මූලධර්ම මත පිහිටා එක් එක් පළාත තුළ පවත්නා මානව ප්‍රාග්ධනය සහ පාරිසරික සම්පත් වල ඵලදායි ලෙස භාවිතා කරමින් ආදායම් ප්‍රභවයන් වඩාත් ශක්තිමත් කිරීම.

02. බාහිර සංක්‍රමණ අනුපාතය සාපේක්ෂව වඩා ඉහල මට්ටමක පවත්නා පළාත් පාලන ආයතනයන්හි එකී අවම කිරීමට සුදුසු ප්‍රතිපත්ති හා දිගු කාලීන වැඩ සටහන් හඳුන්වාදීම.

03. ශ්‍රී ලංකාවේ සමස්ථ සමාජ, ආර්ථික සංවර්ධන ක්‍රියාවලියෙහි සුරක්ෂිත බව උදෙසා එක් එක් පළාතෙහි පවත්නා මානව සම්පතෙහි උපයෝගිතාවය වඩාත් තහවුරු කිරීම.

| | | |
|---|---|---|
| 2016 සමස්ත මූල්‍ය ඉලක්ක/ ප්‍රගතිය | රු. මි. 103.0 | රු. මි. 78.68 |
| 2016 සමස්ත භෞතික ඉලක්ක/ ප්‍රගතිය | 100% | 100% |



## 6.3.1.1. පසුගාමී පළාත් පාලන ආයතන සංවර්ධන සහාය වැඩසටහන

අඩු ආදායම් ලබන පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් නංවාලීම අරමුණු කරගත් මෙම වැඩසටහන පහත සඳහන් ව්‍යාපෘති තෙවන කාර්තුවේ අවසානයට අනුමත කර ඇත.

වගු අංක 1 - පසුගාමී පළාත් පාලන ආයතන සංවර්ධන සහාය වැඩසටහන යටතේ අනුමත ව්‍යාපෘති

| | | | |
|---|---|---|---|
| 01 | සාලිය වැව බස්නැවතුම් පොළ වටා වාණිජ කඩ කාමර 10 ක් බිම් මහලේ ඉදිකිරීම | කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව | 5,000,085.21 |
| 02 | ඇකිරියන්කුඹුර කඩකාමර සකස්කිරීම සඳහා වන ව්‍යාපෘතිය | රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව | 1,785,665.00 |
| 03 | 5 කණුව පුස්තකාල භූමියේ ප්‍රාදේශීය සභා ජල ටැංකිය අසල ජල පිරිපහදු යන්ත්‍රයක් සවි කර පිරිසිදු ජලය බෙදාහැරීම | රාජාංගනය ප්‍රාදේශීය සභාව | 2,594,299.47 |
| 04 | රඹෑව නගරයේ ලෝහ භාණ්ඩ හා අත්‍යන්ත්‍ර රෙදි පිළි ප්‍රදර්ශණාගාරය සහ අලෙවි මධ්‍යස්ථානය ඉදිකිරීම (මෙතෙක් ගෙවීම් සිදු කර නොමැත.2017 වර්ෂයේ මුදල් ගෙවීමට නියමිතය) | රඹෑව ප්‍රාදේශීය සභාව | 5,741,558.20 |
| | | **මුළු එකතුව** | **15,121,607.88** |

**මූලාශ්‍රයඃ පළාත් පාලන අංශය**


### 6.3.1.2. අබලන් වාහන අලුත් වැඩියා කිරීම

පළාත් පාලන ආයතනවල ප්‍රවාහන පහසුකම් නංවාලීමේ අරමුණින් ක්‍රියාත්මක කෙරෙන මෙම වැඩසටහන යටතේ 2016 වර්ෂයට වෙන් වූ රු.මි. 30න් රු. 22.14 ක ව්‍යාපෘති අනුමත කර ඇති අතර රු.මි. 21.6 ක ගෙවීම් සිදු කර ඇත.

### 6.3.1.3. පළාත් පාලන මාසය - 2016

පළාත් පාලන ආයතන මගින් සැපයෙන සේවාවන්හි ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් වාර්ෂිකව පැවැත්වෙන පළාත් පාලන සතිය 2016 වසරේදී 'පළාත් පාලන මාසය' වශයෙන් පැවැත්වීමට කටයුතු කෙරිණි. ඒ අනුව ''ඵලදායී සේවාවන්හි තිරසර සංවර්ධනයක්'' යන තේමාව යටතේ සියලුම පළාත් පාලන කොමසාරිස්වරුන් විසින් පහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය කෙරෙන පරිදි සකස් කරන ලද වැඩසටහන් ඔක්තෝම්බර් මාසය පුරා ක්‍රියාත්මක කිරීමට කටයුතු යෙදුණි.

- බලප්‍රදේශයේ ජනතාවට ලබාදෙන සේවාවන් පිළිබඳ අදහස් / පැමිණිලි / යෝජනා ලබාගැනීම සඳහා
- ආදායම් ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ජංගම සේවා ක්‍රියාත්මක කිරීම
  - කසල කළමනාකරණ වැඩසටහන් පැවැත්වීම
  - සෞඛ්‍ය හා සනීපාරක්ෂක වැඩසටහන් පැවැත්වීම
  - අධ්‍යාපන හා පුස්තකාල වැඩසටහන් පැවැත්වීම
  - මහජන උපයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
  - පරිසර හා රුක් රෝපන වැඩසටහන් පැවැත්වීම
  - ක්‍රීඩා වැඩසටහන් පැවැත්වීම
  - පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබාදෙන ලද ප්‍රාග්ධන හා පුනරාවර්තන ප්‍රතිපාදනයන්ගෙන් ලැබුණු ප්‍රතිලාභ ජනතා අයිතියට පත්කිරීම



### 6.3.1.4. පළාත් පාලන කළමනාකරණ තරගය- 2016 (ස්වර්ණ පුරවර)

- ඒ ඒ පළාත් මඟින් 2016 ජුලි සහ අගෝස්තු යන මාස වලදී පළාත් මට්ටමේ කාර්ය සාධන තරඟ පවත්වා ලබාගත් තරඟ ප්‍රතිඵල මත 2016 ඔක්තොම්බර් මාසයේදී අමාත්‍යාංශය මඟින් ජාතික මට්ටමෙන් පළාත් පාලන ආයතන ඇගයීම සිදුකරන ලද අතර ජයග්‍රාහී පළාත් පාලන ආයතන වෙත සහතික සහ ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා ස්වර්ණ පුරවර ජාතික සම්මාන උළෙල 2016.12.20 දින අති උත්කර්ෂවත් අන්දමින් නෙළුම් පොකුණ රඟහලේදී පවත්වන ලදි.

- මෙම සම්මාන උළෙලේදී මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා මට්ටමින් ප්‍රථම, දෙවන සහ තෙවන ස්ථාන දිනා ගත් පළාත් පාලන ආයතන 9 ට අමතරව විශේෂ කුසලතා දැක්වූ පළාත් පාලන ආයතන 35 ක් සඳහා සහ කුසලතා දැක්වූ පළාත් පාලන ආයතන 5 ක් සඳහා කුසලාන, සහතික පත්‍ර සහ මුදල් ත්‍යාග පිරිනමන ලදී.

**2016 වර්ෂයේ ජාතික මට්ටමේ ප්‍රථම ස්ථානය ජයග්‍රහණය කළ පළාත් පාලන ආයතන**

01. මහනුවර මහා නගර සභාව
02. බලන්ගොඩ නගර සභාව
03. වාරියපොල ප්‍රාදේශීය සභාව

**2016 වර්ෂයේ ජාතික මට්ටමේ දෙවන ස්ථානය ජයග්‍රහණය කළ පළාත් පාලන ආයතන**

01. හම්බන්තොට මහා නගර සභාව
02. කුලියාපිටිය නගර සභාව
03. දික්වැල්ල ප්‍රාදේශීය සභාව

**2016 වර්ෂයේ ජාතික මට්ටමේ තෙවන ස්ථානය ජයග්‍රහණය කළ පළාත් පාලන ආයතන**

01. කුරුණෑගල මහා නගර සභාව
02. තංගල්ල නගර සභාව
03. නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව

**2016 වර්ෂයේ විශේෂ කුසලතා මට්ටම ලබා ගත් පළාත් පාලන ආයතන**

**ප්‍රාදේශීය සභා**

01. මන්මුනෙයිපත්තු ප්‍රාදේශිය සභාව
02. කුරුණෑගල ප්‍රාදේශිය සභාව
03. බලපිටිය ප්‍රදේශීය සභාව
04. දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශිය සභාව
05. පූජාපිටිය ප්‍රාදේශිය සභාව
06. පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභාව
07. යක්කලමුල්ල ප්‍රාදේශිය සභාව
08. කෑගල්ල ප්‍රාදේශිය සභාව
09. බණ්ඩාරගම ප්‍රාදේශිය සභාව
10. ගලිගමුව ප්‍රාදේශිය සභාව
11. වලිකාමම් (දකුණ) ප්‍රාදේශිය සභාව
12. දොම්පෙ ප්‍රාදේශීය සභාව
13. පන්විල ප්‍රාදේශීය සභාව
14. කෝරළේපත්තු ප්‍රාදේශීය සභාව
15. ගොඩකවෙල ප්‍රාදේශීය සභාව
16. නල්ලූර් ප්‍රාදේශීය සභාව
17. නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව
18. මහර ප්‍රාදේශීය සභාව
19. බුලත්සිංහල ප්‍රාදේශීය සභාව
20. කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව
21. වවුනියාව (දකුණ) දෙමළ ප්‍රාදේශීය සභාව

| නගර සභා | මහා නගර සභා |
|---|---|
| 01. අම්බලන්ගොඩ නගර සභාව | 01. කඩුවෙල මහා නගර සභාව |
| 02. මිනුවන්ගොඩ නගර සභාව | 02. නුවරඑළිය මහා නගර සභාව |
| 03. වැලිගම නගර සභාව | 03. මාතර මහා නගර සභාව |
| 04. සීතාවකපුර නගර සභාව | 04. යාපනය මහා නගර සභාව |
| 05. හොරණ නගර සභාව | |
| 06. කඩුගන්නාව නගර සභාව | |
| 07. ත්‍රිකුණාමලය නගර සභාව | |
| 08. නාවලපිටිය නගර සභාව | |
| 09. කාත්තන්කුඩි නගර සභාව | |
| 10. තලවකැලේ ලිඳුල නගර සභාව | |

**2016 වර්ෂයේ කුසලතා මට්ටම ලබා ගත් පළාත් පාලන ආයතන නාම ලේඛනය**

01. හලාවත නගර සභාව
02. එරාවූර් නගර සභාව
03. පුත්තලම නගර සභාව
04. අනුරාධපුර මහා නගර සභාව
05. දඹුල්ල මහා නගර සභාව

වගු අංක 2 - මූල්‍ය හා භෞතික ඉලක්ක හා ප්‍රගතිය (2016 සිව්වන කාර්තුවේ අගට

| වැඩසටහන | 2016 වර්ෂය සඳහා වෙන්වූ ප්‍රතිපාදන (රු.මි.) | සිව්වන කාර්තුවේ මූල්‍ය ප්‍රගතිය | | | සිව්වන කාර්තුවේ භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක රු.මි. | ප්‍රගතිය රු.මි. | % | ඉලක්ක | ප්‍රගතිය |
| පසුගාමී පළාත් පාලන ආයතන සංවර්ධන සහාය වැඩසටහන | 50 | 50 | 42.72 | 85 | 100% | 100% |
| අබලන් වාහන අළුත්වැඩියා කිරීම | 30 | 30 | 21.60 | 72 | 100% | 90% |
| පළාත් පාලන සතිය සහ පළාත් පාලන ආයතන කළමනාකරණ තරඟය | 23 | 23 | 14.36 | 0 | 100% | 100% |
| එකතුව | 103 | 103 | 78.68 | 76 | 100% | 100% |

මූලාශ්‍රයඃ පළාත් පාලන අංශය

**6.3.1.5. පළාත් පාලන කොට්ඨාස සීමා නිර්ණ අභියාචනා විමර්ශන කමිටුව**

ජාතික සීමා නිර්ණය කමිටු වාර්තාව පදනම් කරගෙන අංක 1928/26 හා 2012.08.21 දිනැති ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද කොට්ඨාස මායිම්වල නිරවද්‍යතාවය පිළිබඳව සමාජය තුළ කතාබහක් ඇති වූ අතර, එයට විරුද්ධව යෝජනා/අභියාචනා/චෝදනා ඉදිරිපත් වුණි.

මෙලෙස පළාත් පාලන ආයතනය කොට්ඨාස මායිම් ගැසට් කිරීමෙන් අනතුරුව දිගින් දිගටම ලිඛිත හා වාචික අභියාචනා/පැමිණිලි ඉදිරිපත් වීම හේතුවෙන් එම අභියාචනා/පැමිණිලි සාධාරණව විමර්ශනයට ලක් කර නැවත කොට්ඨාස මායිම් සංශෝධනය කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගුණි. ඒ අනුව පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකාරිය) 3 (ඇ) වගන්තිය යටතේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙත පැවරූ බලතල ප්‍රකාරව 2015.12.22 දිනැතිව (පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකාරිය) 3 (ඇ) වගන්තිය යටතේ සීමා නිර්ණය සම්බන්ධ අභියාචනා විමර්ශන කමිටුව පත් කරන ලදී.

**අභියාචනා විමර්ශන කමිටුවේ සංයුතිය:**

| | | |
|---|---|---|
| ටී. අශෝක පීරිස් මහතා | - | සභාපති |
| ඒ.එස්.එම්.මිස්බා මහතා | - | සාමාජික (එක්සත් ජාතික පක්ෂය) |
| උපුල් කුමාරප්පෙරුම මහතා | - | සාමාජික (ජනතා විමුක්ති පෙරමුණ) |
| සී.එන්.එස්. සාලිය විමලසූරිය මැතිව් මහතා | - | සාමාජික (ශ්‍රී ලංකා නිදහස් පක්ෂය) |
| මහාචාර්ය පී. බාලසුන්දරම් පිල්ලේ | - | සාමාජික (ඉලංගෙෙ තමිල් ඇරසුක් කච්චි) |

**කාර්ය භාරය**

අභියාචනා විමර්ශන කමිටුවේ කාර්ය භාරය වන්නේ සීමා නිර්ණය ජාතික කමිටුව විසින් සිදු කරන ලද කොට්ඨාස සීමා නිර්ණය සම්බන්ධයෙන් ඉදිරිපත් වන යෝජනා/අභියාචනා සලකා බලා සුදුසු පරිදි කොට්ඨාස මායිම්, නම්, අංක හෝ අක්ෂර සංශෝධනය කිරීම යි.

2015.11.01 දින පත් කරන ලද මෙම කමිටුවේ කාලසීමාව 2016.01.31 දිනෙන් අවසන් වීමට නියමිතව තිබුණ ද, ඒ දක්වාම ලැබෙමින් තිබූ අති මහත් යෝජනා/අභියාචනා සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ඉදිරියටත් මෙවැනි අඩුපාඩු සිදුවීම මග හරවා ගැනීමේ අරමුණින් හා වඩා විනිවිද භාවයකින් මෙම කාර්යය ඉටු කිරීමේ අරමුණින් යුතුව දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි එ පිළිබඳ උනන්දුවක් දක්වන මහජනතාව, සිවිල් සංවිධාන හා දේශපාලන පක්ෂ කැඳවා දිස්ත්‍රික මට්ටමින් සාකච්ඡා පැවැත්වීම සඳහා පළාත් සභා හා පළාත් පාලන ගරු අමාත්‍යවරයා විසින් උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව අභියාචනා විමර්ශන කමිටු නිර්දේශ සහිත අවසන් වාර්තාව ලබාදීමෙන් අනතුරුව පළාත් පාලන මැතිවරණය පැවැත්වීම සඳහා අවශ්‍යවන්නාවූ ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිතය.

# 6.3.2. පළාත් සභා අංශය

**අරමුණ**

පළාත් සභාවල ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම, මධ්‍යම රජය හා පළාත් සභා අතර සම්බන්ධීකරණය හා පළාත් සභාවල මානව සම්පත් සංවර්ධනය මගින් ඵලදායී හා කාර්යක්ෂම පළාත් සභා පරිපාලන ක්‍රමයක් ඇති කිරීම

**උපාය මාර්ග**

1. රටේ සමස්ත සමාජ-ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයට දායකවීම සඳහා එක් එක් පළාතේ පවත්නා මානව සම්පත උපයෝගී කරගැනීම තහවුරු කිරීම

2. මානව සම්පත් සංවර්ධනය සහ විද්‍යාත්මක පදනමක් මත පළාත් පාලන ආයතන උත්ශ්‍රේණිගත කිරීම මගින් ඵලදායී හා කාර්යක්ෂම පළාත් සභා සහ පළාත් පාලන පරිපාලන ක්‍රමයක් සහතික කිරීම



**වගු අංක 3- පළාත් සභා අංශයේ ප්‍රගතිය (2016.12.31 දිනට)**

| අනු අංකය | යෝජනාව | උප ක්‍රියාකාරක |
|---|---|---|
| 01 | ඉඩම් අත්පත් කරගැනීම | අදාළ ඉල්ලීම් 37ක් පරීක්ෂාකර බලා ඉඩම්අමාත්‍යාංශය වෙත නිර්දේශ යොමු කර ඇත. අඩුපාඩු සහිතව එවා ඇති ඉල්ලීම් 124ක් නැවත ප්‍රධාන ලේකම් වෙත යොමු කර ඇත. 1964 අංක 28 දරණ ඉඩම් අත්පත් කරගැනීම් පනතේ 04 වන වගන්තිය ප්‍රකාරව විරෝධතා පරීක්ෂණ පැවැත්වීම සඳහා පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව නිලධාරීන් 08 දෙනෙකු පත් කර ඇත. |
| 02 | රා.පරි.ච.ලේ.06/2006 අනුව පළාත්රාජ්‍ය සේවයට අදාළ තනතුරු සඳහා සේවා ව්‍යවස්ථා සම්පාදනය කිරීම | 06/2006 චක්‍රලේඛ අනුව සකසා අවසන් කොට ඇති සේවා ව්‍යවස්ථා 04 ක් සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලු පිළිබඳ ක්‍රියා කරමින් පවතී. |
| 03 | පළාත් සභා ධූරධාරීන් හා නිලධාරීන් සම්බන්ධ කරගත හැකි තොරතුරු කාර්තුමය වශයෙන් යාවත්කාලීන කිරීම | කාර්තුමය වශයෙන් තොරතුරු පොත් පිංච සකස් කර ඇත |
| 04 | පළාත් සභාවන්ට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ | I. පළාත් සභාවන්ට අදාල ගැටලු පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශ 03 ක් සකස් කර ඇත.<br>II.අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ 07 ක් අදාළ පළාත් වෙත ඉදිරිපත් කිරීම හා අදාල තීරණ 17 ක් පිළිබඳ ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර ඇත. |
| 05 | පාර්ලිමේන්තු ප්‍රශ්න | පාර්ලිමේන්තු ප්‍රශ්න 20 ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. |
| 06 | මහජන පෙත්සම්<br>I. පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරකසභාව වෙතින් ලැබෙන පෙත්සම් | පෙත්සම් 20 ක් පාර්ලිමේන්තුවට යොමු කර ඇත.<br>පෙත්සම් 04 ක් වාර්තා ගෙන්වා ගැනීම සඳහා පළාත් වෙත යොමු කර ඇත. |
| 07 | පළාත් සභා සඳහා වාහන මිලදී ගැනීම සහ දීප ව්‍යාප්ත සේවයේ විශ්‍රාමික නිලධාරීන් වෙත තීරු බදු සහන සහිත වාහන ආනයන බලපත්‍ර නිකුත් කිරීම<br>I. රා.පරි.ච.ලේ.22/99ට අදාළ නිර්දේශ ලබාදීම<br>II.ජාතික අයවැය චක්‍රලේඛ අංක 1/2016 අනුව පළාත් සභා සඳහා වාහන මිලදී ගැනීම. | ලද අයදුම්පත් 33 ක් නිර්දේශ කර වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.<br>වියදම් පාලන කමිටුවේ අනුමැතිය සඳහා අයදුම්පත් 15ක් යොමු කර ඇත. |
| 08 | නව තනතුරු ඇතිකිරීම | පළාත් සභා හා පළාත් පාලන අයතන සඳහා නව තනතුරු ඇතිකිරීමට කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2014 පරිදි ලැබී ඇති ඉල්ලීම් 2940 ක් නිර්දේශ කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. |
| 09 | විදේශීය ස්වේච්ඡා සේවකයින් සඳහා වීසා ලබාදීම / කාලය දීර්ඝ කිරීම | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ස්වේච්ඡා සේවකයින්ට වීසා ලබාදීම සඳහා එවා ඇති ඉල්ලීම් 35 ක් එකඟතාවය ලබාගැනීම සඳහා පළාත් වෙත යොමු කර ඇත.<br><br>පළාත් වෙතින් එකඟතාවය ලැබී ඇති වීසා ඉල්ලීම් 18 ක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |
| 10 | පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ රැස්වීම් | රැස්වීම් වාර 06 ක් පවත්වා ඇත |
| 11 | පළාත් සභා ධූරධාරීන්ගේ වරප්‍රසාද දීමනා හා පහසුකම් | පළාත් සභා අනුමත ධූරධාරීන්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳ සමරූපීතාවයක් ඇති කිරීම සඳහා පළාත් සභා වලින් ගෙන්වා ගත් තොරතුරු පදනම් කරගෙන කෙටුම්පත් චක්‍රලේඛය සකස් කර 2016.1207 දින ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කර ඇත. |
| 12 | දේශපාලන හේතූන් මත විවිධ ගැටලුවලට මුහුණදුන් අයට සහන සැලසීම | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයෙන් යොමු කරන ලද අභියාචනා 204ක් අදාළ පළාත් සභා වෙත 2016.08.08 දින ඉදිරි පියවර ගැනීම සඳහා යොමු කර ඇත. |


## 6.3.3. සංවර්ධන අංශය


**අරමුණ**

පළාත් පාලන ආයතනවල සහ ඒවායේ බල ප්‍රදේශවල ජීවත් වන ප්‍රජාවන්ට ප්‍රතිලාභ සැලසෙන යටිතල පහසුකම ශක්තිමත් කිරීම සඳහා දේශීය හා විදේශීය අරමුදල් මත අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක කෙරෙන සංවරධන වැඩසටහන් සැලසුම කිරීම හා මෙහෙයවීම මගින් අන්තර් පළාත් විෂමතා අවම කිරීමට දායක වීම.

| | |
|---|---|
| උපාය මාර්ග | 1. රටේ සමස්ත සමාජ-ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයට දායකවීම සඳහා එක් එක් පළාතේ පවත්නා මානව සම්පත උපයෝගී කරගැනීම තහවුරු කිරීම<br><br>2. මානව සම්පත් සංවර්ධනය සහ විද්‍යාත්මක පදනමක් මත පළාත් පාලන ආයතන උත්ශ්‍රේණිගත කිරීම මගින් ඵලදායී හා කාර්යක්ෂම පළාත් සභා සහ පළාත් පාලන පරිපාලන ක්‍රමයක් සහතික කිරීම<br><br>3. සංක්‍රමණ අනුපාතයට සාපේක්ෂව ඉහළ මට්ටමක පවතින පළාත්වල එම මට්ටම අවම කිරීම සඳහා වඩාත් යෝග්‍ය ප්‍රතිපත්ති හා දීර්ඝකාලීන වැඩසටහන් සම්පාදනය කිරීම සහ හඳුන්වාදීම<br><br>4. එක් එක් පළාතේ පවතින ස්වාභාවික සම්පත්වල තිරසර භාවිතය සහතික කරන අතරේ, ආපදා අවදානම් අවම කිරීමේ හා ආපදා අවස්ථාවලට මුහුණ දීමේ ක්‍රියාමාර්ගයන් ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන ක්‍රියාකාරකම්වලට ඒකාබද්ධ කිරීම<br><br>5. බිම් මට්ටමේ ප්‍රජා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ප්‍රජා සහභාගීත්වය වර්ධනය කිරීම මගින් පළාත්වල පවතින සම්පත් සජීවීකරණය කිරීම සහ ග්‍රාමීය ප්‍රජාවගේ අගයයන් හා ශක්‍යතාවන් බලාත්මක කිරීම<br><br>6. යහපාලන මූලධර්ම පිළිපදිමින් එක් එක් පළාතේ පවත්නා මානව ප්‍රාග්ධනය හා පාරිසරික සම්පත් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගනිමින් සෑම පළාතක ම ආදායම් උත්පාදන හැකියාව වර්ධනය කිරීම |

| | | |
|---|---|---|
| 2016 සමස්ත මූල්‍ය ඉලක්ක (ප්‍රතිපාදන) රු.මි. | 36,146.51 | |
| දේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති(රු.මිලියන) | 4,750.00 | |
| විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති(රු.මිලියන) | 31,396.51 | |
| සමස්ත මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන) | 31,396.51 | |
| 2016 සිව්වන කාර්තුවට මූල්‍ය ඉලක්ක/ ප්‍රගතිය | 36,146.51 | 28,563.91 |
| 2016 සිව්වන කාර්තුවට භෞතික ඉලක්ක/ ප්‍රගතිය | 100% | 87% |





සටහන: අක්මුදල් අවශ්‍ය පරිදි නොලැබීම මූල්‍ය ප්‍රගතිය අඩුවීමට බලපාන ලදී.

# 6. 3. 3. 1. දේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති

## 6.3.3.1.1. ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන

**"ප්‍රාදේශීය සභා නඩත්තු ඒකක මඟින් ප්‍රජා යටිතල පහසුකම් නඩත්තු කිරීම සඳහා සෑම ප්‍රාදේශීය සභාවකටම මසකට රු. 1,000,000.00 බැගින්ලබාදීම."**

| | |
|---|---|
| අරමුණ | ප්‍රමාණවත් ආදායම් මාර්ග නොමැතිවීම නිසා ප්‍රජා යටිතල පහසුකම් වැඩි දියුණු වී නොමැති ප්‍රාදේශීය සභාවල එම පහසුකම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සහ එමඟින් ජනතාවට ලබාදෙන සේවාවන්වල ගුණාත්මකභාවය හා ඵලදායීබව ඉහළ නැංවීම |
| ප්‍රධාන ක්‍රියාකාරකම් | ප්‍රජා යටිතල පහසුකම් නඩත්තු කිරීම, අලුත්වැඩියාව සහ පුනරුත්ථාපනය කිරීම |
| ක්‍රියාත්මක ප්‍රදේශය | දිවයිනේ සියලුම ප්‍රාදේශීය සභා (271) |
| 2016 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන | රු.මි. 2000.0 |
| වියදම (2016-12-31 දිනට) | රු. මි. 920.64 |
| | |




සටහන: අක්මුදල් අවශ්‍ය පරිදි නොලැබීම මූල්‍ය ප්‍රගතිය අඩුවීමට බලපාන ලදී.

වගු අංක 4 - ප්‍රාදේශීය සහා ශක්තිමත් කිරීමේ වැඩසටහන - මූල්‍ය ප්‍රගතිය (2016-12-31ට)

| | පළාත | ප්‍රා.ස. සංඛ්‍යාව | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | අනුමත ව්‍යාපෘති වටිනාකම (රු.මි.) | ලබාදුන් මුදල (රු.මි.) |
|---|---|---|---|---|---|
| 1. | බස්නාහිර | 27 | 253 | 138.28 | 110.46 |
| 2. | වයඹ | 29 | 408 | 150.23 | 124.51 |
| 3. | උතුරු මැද | 25 | 171 | 85.89 | 72.39 |
| 4. | මධ්‍යම | 31 | 328 | 127.10 | 65.38 |
| 5. | ඌව | 25 | 131 | 46.24 | 27.16 |
| 6. | සබරගමුව | 25 | 138 | 68.38 | 58.93 |
| 7. | නැගෙනහිර | 37 | 551 | 182.19 | 172.44 |
| 8. | උතුර | 28 | 306 | 152.54 | 157.62 |
| 9. | දකුණ | 42 | 358 | 160.84 | 72.47 |
| 10. | 2016 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් ලබාදීම | | | | 59.22 |
| | එකතුව | 269 | 2644 | 1,111.74 | 920.63 |

මූලාශ්‍රයः සංවර්ධන අංශය

# 6.3.3.1.2. පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් නගාසිටුවීමේ ප්‍රාග්ධන වැඩසටහන

**අරමුණ**


පළාත් පාලන ආයතනවල ප්‍රජා යටිතල පහසුකම් අලුතින් ඉදිකිරීම සඳහා අවශ්‍ය සහාය ලබාදීමත් එමගින්, පළාත් පාලන ආයතන වෙතින් මහජනතාවට සැපයෙන සේවාවන්වල ගුණාත්මකභාවය හා ඵලදායීබව ඉහළ නැංවීම.



**ප්‍රධාන ක්‍රියාකාරකම්**

පළාත් පාලන ආයතන බලප්‍රදේශවල කාණු පද්ධති, අතුරුපාරවල්, දිනපොළ / සතිපොළ, පොදු වැසිකිළි පහසුකම්, ප්‍රජා ජල ව්‍යාපෘති,සංචාරක ආකර්ෂණීය ස්ථාන වැනි අත්‍යවශ්‍ය ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

| | |
|---|---|
| ක්‍රියාත්මක ප්‍රදේශය | සියලුම පළාත් පාලන ආයතන (335) |
| 2016 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන | රු.මි. 1500.0 |
| වියදම (2016-12-31 දිනට) | රු. මි. 516.09 |




සටහන: අක්මුදල් අවශ්‍ය පරිදි නොලැබීම මූල්‍ය ප්‍රගතිය අඩුවීමට බලපාන ලදී.

නාගරීකරණයත් සමග ඉහළ යන මහජන අවශ්‍යතාවලට සරිලන පරිදි පළාත් පාලන ආයතන බලප්‍රදේශවල අත්‍යවශ්‍ය ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය නොවීම හේතු කොටගෙන එම ප්‍රදේශවල ජීවත් වන මහජනතාවට විවිධ දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදුවේ. මේ තත්ත්වයට පිළියමක් ලෙස පළාත් පාලන ආයතනවල ප්‍රජා යටිතල පහසුකම් අලුතින් ඉදිකිරීම සඳහා අවශ්‍ය සහාය ලබාදීම මගින්, පළාත් පාලන ආයතන තුළින් මහජනතාවට ලබාදෙන සේවාවන්වල ගුණාත්මකභාවය හා ඵලදායීබව ඉහළ නැංවීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති ක්ෂේත්‍ර පහත දැක්වේ.

1. පහසු මධ්‍යස්ථාන ඉදිකිරීම
2. කාණු පද්ධති හා මලාපවහන පද්ධති ඉදිකිරීම
3. අතුරු පාරවල් සංවර්ධනය කිරීම
4. නව ප්‍රජා ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
5. සංචාරක ආකර්ෂණීය ස්ථාන වැඩිදියුණු කිරීම
6. තාවකාලික ආලෝක සංඥා පද්ධති සවිකිරීම
7. දිනපොළ / සතිපොළ ඉදිකිරීම

**කෑගල්ල දිස්ත්‍රික්කයේ ආපදා හානි සිදු වූ පළාත් පාලන ආයතනවලට අයත් මාර්ග සංවර්ධනය කිරීම**

2016 වර්ෂයේ මැයි මාසයේ පැවති අධික වර්ෂාව නිසා ඇති වූ ආපදා තත්ත්වයෙන් විශාල හානි සිදු වූ කෑගල්ල දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය මූලික කරගෙන කෑගල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් ගන්නා ලද තීරණය පරිදි ආපදා හානි සිදු වූ පළාත් පාලන ආයතන සතු මාර්ග සංවර්ධනය සඳහා මෙම අමාත්‍යාංශයේ දායකත්වය ලබාදීමට සිදු විය.

මෙහිදී කෑගල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් හඳුනාගැනුණු ආපදා හානි සිදු වූ පළාත් පාලන ආයතනවලට අයත් මාර්ග සංවර්ධනය සඳහා ප්‍රමුඛතාව දෙමින් මෙම වැඩසටහන යටතේ ලබාදෙන උපරිම ප්‍රතිපාදන සීමාව නොසලකා ප්‍රතිපාදන ලබාදීමට අමාත්‍යාංශය විසින් විශේෂ තීරණයක් ගනු ලැබිණි. ඒ අනුව ඔක්තෝම්බර් මස 30 වන විට පළාත් පාලන ආයතන මාර්ග 158.ක් සඳහා රු.මි.91.11 ක් අනුමත කර ඇත.

වගු අංක 5 - කෑගල්ල දිස්ත්‍රික්කයේ ආපදා හානි සිදු වූ පළාත් පාලන ආයතන මාර්ග සංවර්ධනය (2016-12-31 දිනට අනුමත ව්‍යාපෘති)

| | පළාත් පාලන ආයතනය | මාර්ග සංඛ්‍යාව | ඇස්තමේන්තු වටිනාකම රු.මි. |
|---|---|---|---|
| 1. | යටියන්තොටප්‍රා.ස | 12 | 11.61 |
| 2. | බුලත්කොහුපිටියප්‍රා.ස | 30 | 13.07 |
| 3. | රුවන්වැල්ලප්‍රා.ස | 9 | 10.18 |
| 4. | ගලිගමුවප්‍රා.ස | 12 | 5.24 |
| 5. | වරකාපොලප්‍රා.ස | 11 | 8.01 |
| 6. | මාවනැල්ලප්‍රා.ස | 6 | 3.57 |
| 7. | දැරණියගලප්‍රා.ස | 43 | 12.35 |
| 8. | අරණායකප්‍රා.ස | 22 | 14.06 |
| 9. | කෑගල්ලප්‍රා.ස | 13 | 9.90 |
| | එකතුව | 158 | 91.11 |

මූලාශ්‍රයඃ සංවර්ධන අංශය

වගු අංක 6 - පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන (2016-12-31 දිනට ප්‍රගතිය)

| | පළාත | ප්‍රා.ස. සංඛ්‍යාව | ව්‍යාපෘති ගණන | ව්‍යාපෘති වටිනාකම (රු.මි.) | වැඩ අවසන් ව්‍යාපෘති ගණන | ක්‍රියාත්මක වන ව්‍යාපෘති ගණන |
|---|---|---|---|---|---|---|
| 1. | ඌව පළාත | 28 | 136 | 97.55 | 98 | 38 |
| 2. | මධ්‍යම පළාත | 42 | 180 | 163.21 | 37 | 132 |
| 3. | දකුණු පළාත | 45 | 167 | 154.08 | 14 | 67 |
| 4. | බස්නාහිර පළාත | 43 | 117 | 222.34 | 22 | 66 |
| 5. | උතුරු මැද පළාත | 26 | 103 | 83.66 | 15 | 87 |
| 6. | උතුරු පළාත | 34 | 50 | 136.00 | 15 | 35 |
| 7. | වයඹ පළාත | 32 | 113 | 178.83 | 10 | 80 |
| 8. | නැගෙනහිර පළාත | 45 | 107 | 179.32 | 7 | 98 |
| 9. | සබරගමුව පළාත | 30 | 238 | 145.69 | 1 | 15 |
| | **එකතුව** | **325** | **1211** | **1,360.68** | **219** | **618** |

මූලාශ්‍රය: සංවර්ධන අංශය

වැලිමඩගම අම්පිටතැන්න මාර්ගය කොන්ක්‍රීට් කිරීම - වැලිමඩ ප්‍රා.ස. - ඌව පළාත)

පෙර



පසු



බුත්තල පොළ භූමිය සංවර්ධනය කිරීම - (බුත්තල ප්‍රා.ස.ඌව පළාත)



දෙමටබැද්ද කපුකොටුව මාර්ගය බෝක්කුව හා මාර්ගය සංවර්ධනය කිරීම (සියඹලාණ්ඩුව ප්‍රාස-ඌව පළාත)

පෙර



පසු



# 6.3.3.1.3. පළාත් පාලන ආයතන සතු පුස්තකාල සංවර්ධන වැඩසටහන - පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම (විද්‍යුත් පුස්තකාල)

<table>
<tr><td rowspan="6"></td><td>ප්‍රධාන ක්‍රියාකාරකම්</td><td>තෝරාගත් පුස්තකාල සඳහා අවශ්‍ය කරන සම්පත් දෘඩාංග, මෘදුකාංග සහ පුහුණුව ලබාදීමට කටයුතු කරනු ලැබේ</td></tr>
<tr><td>ක්‍රියාත්මක ප්‍රදේශය</td><td>සියලුම දිස්ත්‍රික්ක</td></tr>
<tr><td>ක්‍රියාත්මක කිරීමේ සහාය</td><td>➢ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය<br>➢ උතුරු නැගෙනහිර පළාත් පාලන සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය</td></tr>
<tr><td>ඇස්තමේන්තුව</td><td>➢ රු.මි. 18.3</td></tr>
<tr><td>2016 ප්‍රතිපාදන</td><td>රු.මි. 20.0</td></tr>
<tr><td>වියදම</td><td>රු. මි. 7.2</td></tr>
</table>

**පුස්තකාල ස්වයංක්‍රීයකරණය**


2016 වර්ෂය සඳහා වෙන් කෙරුණු රු.මි. 20.0න් අවිච්ඡේද ගෙවීම් සිදු කොට ඉතිරි වූ රු.මි. 18.3ක ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් දිවයිනේ පළාත් පාලන ආයතන මගින් පාලනය වන පුස්තකාල අතුරින් තෝරාගැනෙන පුස්තකාල 22ක් විද්‍යුත් පුස්තකාල බවට පරිවර්තනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. මේ සඳහා පුස්තකාල සේවා මණ්ඩලය හා විවෘත විශ්වවිද්‍යාලය යන ක්ෂේත්‍රයේ පළපුරුදු රාජ්‍ය ආයතන සමඟ සාකච්ඡා කිරීමේදී පුස්තකාල ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලියේ වැදගත්කම අවබෝධ වීම නිසා ඒ සම්බන්ධ ප්‍රවීණ විවෘත විශ්වවිද්‍යාලය සම්බන්ධ කරගෙන එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට තීරණය කෙරිණි. පෙර සැලසුම් කළ විද්‍යුත් පුස්තකාල ක්‍රමය හුදෙක් පරිගණක උපාංග" කාර්යාලයීය ලී බඩු" උපකරණ හා සංයුක්ත තැටි ආදිය ලබාදීමේ සරල සංකල්පයක් පදනම් වූව ද පුසතකල ස්වයංක්‍රීයකරණය නවීන තාක්ෂණය සමග වඩාත් ඉදිරියට ගිය වැඩසටහනක් නිසා එහි ඵලදායකත්වය ඉහළ ය.


මේ යටතේ සම්පූර්ණ ස්වයංක්‍රීයකරණය කෙරෙන මහජන පුස්තකාල සංඛ්‍යාව 30ක් වන අතර තවත් පුස්තකාල 10ක් අර්ධ ස්වයංක්‍රීයකරණය සඳහා තෝරා ගැනේ.

මේ වන විට විවෘත විශ්වවිද්‍යාලය විසින් එම තෝරාගත් පුස්තකාල පිළිබඳ අගැයීමක් සිදු කර අවශ්‍ය පරිගණක හා තාක්ෂණික උපකරණ ලබා දී ඇත. තවද, මෙම වැඩසටහනට අදාළ පුහුණු හා ස්ථාපන කටයුතු සඳහා උතුරු නැගෙනහිර පළාත් පාලන සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (නෙල්සිප්) විසින් 2017 වසරේදී මූල්‍ය දායකත්වය ලබා දීමට කටයුතු කෙරේ.

# 6.3.3.1.4. පල්ලෙපොළ නගර සංවර්ධන වැඩසටහන

| | | |
|---|---|---|
| **අරමුණ**<br>කාර්යක්ෂම සහ ඵලදායී පළාත් පාලන සේවාවක් සඳහා පල්ලෙපොල නගරය ආදර්ශමත් නගරයක් වශයෙන් සංවර්ධනය කිරීම | | |
| ප්‍රධාන ක්‍රියාකාරකම් | බහුකාර්ය ගොඩනැගිලි ඉදිකිරීම - අදියර 2 | |
| ක්‍රියාත්මක ප්‍රදේශය | පල්ලෙපොළ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | |
| ක්‍රියාත්මක කිරීමේ සහාය | ❖ නාගරික සංවර්ධන අධිකාරිය<br>❖ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව<br>❖ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | |
| ව්‍යාපෘති කාලය | 2015-2016 | |
| මුළු ඇස්තමේන්තුව | රු.මි. 62.8 | |
| 2016 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන | රු.මි .30.0 | |
| 2016 සිව්වන කාර්තුවට මූල්‍ය ඉලක්ක/ ප්‍රගතිය | රු.මි. 30.0 | රු.මි. 30.0 |
| 2016 සිව්වන කාර්තුවට භෞතික ඉලක්ක/ ප්‍රගතිය | 100% | 90% |
| | | |




සටහන: අක්මුදල් අවශ්‍ය පරිදි නොලැබීම මූල්‍ය ප්‍රගතිය අඩුවීමට බලපාන ලදී.





පල්ලෙපොල නගර සංවර්ධන වැඩසටහන යටතේ පල්ලෙපොල වෙළෙඳ සංකීර්ණය හා බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම (ඉතිරි වැඩ), සමස්ත නගර සැලැස්මට සම්බන්ධ කොට විධිමත් සැලසුම් සහිතව ක්‍රියාත්මක කෙරේ. ඉතා සීඝ්‍රයෙන් නාගරීකරණය වන නගරයක් වුව ද මහජන සේවා පහසුකම් සැලසීමට අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත් ලෙස සම්පාදනය නොමැති තතත්වයක් තුළ එම පහසුකම්වලින් සමන්විත කුඩා හා මධ්‍යම පරිමාණ නගරයක් ලෙස සංවර්ධනය වීම පල්ලෙපොල නගර සංවර්ධනයෙන් අපේක්ෂිත ප්‍රධානතම ප්‍රතිඵලයයි. ඒ අනුව නගරාලංකාරයට මෙන් ම එක් වහලක් යට විවිධ අවශ්‍යතා සපුරාගත හැකි මධ්‍යස්ථානයක් ලෙස මෙම බහුකාර්ය ගොඩනැගිල්ල වැදගත් වේ.


බහුකාර්ය ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ 1 අදියර 2015 දී නිම කෙරුණු අතර එහි දෙවන අදියර 2016 වර්ෂයේ නිම කිරීමට සැලසුම් කෙරිණි. ඒ අනුව පළමු හා දෙවන මහලේ ඇතුළත බිම ටයිල් ඇතිරීම, බිත්ති කපරාරු කිරීම, තීන්ත ආලේපනය, දොර ජනෙල් සවිකිරීම, සනීපාරක්ෂක පහසුකම්, ජලය හා විදුලි පහසුකම් සැපයීම යන කාර්යයන් මේ වර්ෂයේ සිදු කෙරිණි.

# 6.3.3.1.5. උතුරු නැගෙනහිර පළාත් පාලන ආයතනවල නව කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩසටහන

**අරමුණ**

උතුරු හා නැගෙනහිර පළාත්වල ගොඩනැගිලි පහසුකම් අවම පළාත් පාලන ආයතනවල කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම මගින් එම ආයතනවලින් මහජනතාවට වඩාත් කාර්යක්ෂම හා ඵලදායි සේවා සැපයීමට හැකියාව ලබාදීම.

| | |
|---|---|
| ප්‍රධාන ක්‍රියාකාරකම් | පළාත් පාලන ආයතනවල නව කාර්යාල ඉදිකිරීම |
| ක්‍රියාත්මක ප්‍රදේශය | උතුරු හා නැගෙනහිර පළාත් |
| 2016 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන | රු.මි. 50.0 |
| 2016.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය | රු.මි. 8.20 |




**සටහන: අක්මුදල් අවශ්‍ය පරිදි නොලැබීම මූල්‍ය ප්‍රගතිය අඩුවීමට බලපාන ලදී.**

වගු අංක 7 - උතුරු හා නැගෙනහිර පළාත් පාලන ආයතනවල නව කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති - 2016

| | **පළාත් පාලන ආයතනය** | **ව්‍යාපෘතියේ නම** | **2016 අනුමත මුදල (රු.)** | **භෞතික ප්‍රගතිය %** |
|---|---|---|---|---|
| 01. | එරාවුර් නගර සභාව | එරාවුර් නගර සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම - අවසන් අදියර | 25.00 | 100 |
| 02. | කෝරළයිපත්තු (බටහිර) ප්‍රා.ස. - ඔඩ්ඩමාවඩි | ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ දෙවන මහලේ සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීම | 10.00 | 100 |
| 03. | අක්කරෙපත්තු ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල දිගු කිරීම | 5.00 | 100 |
| 04. | එරාවුර්පත්තු ප්‍රාදේශීය සභාව (චෙන්කලඩි) | පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම - අවසන්අදියර | 5.00 | 100 |
| 05. | තඹලගමුව ප්‍රාදේශීය සභාව | කෝවිල්අඩි නව පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම | 5.00 | 100 |
| | | **එකතුව** | **50,000,000.00** | |

මූලාශ්‍රය: සංවර්ධන අංශය

# 6.3.3.1.6. හදිසි ආපදා ප්‍රතිචාර ජාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අදියර III

**අරමුණ**

උතුරු හා නැගෙනහිර පළාත්වල ගොඩනැගිලි පහසුකම් අවම පළාත් පාලන ආයතනවල කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම මගින් එම ආයතනවලින් මහජනතාවට වඩාත් කාර්යක්ෂම හා ඵලදායි සේවා සැපයීමට හැකියාව ලබාදීම.


අරමුණ

පළාත් පාලන ආයතනවලට වැඩි දියුණු කරන ලද ගිනි නිවීමේ යටිතල පහසුකම් ලබාදීම මගින් අනතුරු සහ ආපදා නිසා මහජනතාවට ඇතිවන හානි අවම කරමින් මහජන සුරක්ෂිතතාව තහවුරු කිරීම





| | |
|---|---|
| ප්‍රධාන ක්‍රියාකාරකම් | පළාත් පාලන ආයතන සඳහා ගිනි නිවීමේ යන්ත්‍රෝපකරණ සහ ගිලන් රථ ලබාදීම |
| ක්‍රියාත්මක ප්‍රදේශය | කොළඹ ම.න.ස., මාතලේ ම.න.ස., යාපනේ ම.න.ස., වවුනියා න.ස. , අම්පාර න.ස. වවුනියා න.ස. |
| අරමුදල් මූලාශ්‍රය | නෙදර්ලන්ත ණය අරමුදල |
| 2016 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන | රු.මි. 150.00 |
| වියදම (2016-12-31 දිනට) | රු.මි. 124.72 |




සටහන: අක්මුදල් අවශ්‍ය පරිදි නොලැබීම මූල්‍ය ප්‍රගතිය අඩුවීමට බලපාන ලදී.

## ගිනි නිවීමේ ඒකක ස්ථාපිත කිරීම

නෙදර්ලන්ත ණය අරමුදල් මත ක්‍රියාත්මක කර අවසන් කර ඇති හදිසි ආපදා ප්‍රතිචාර ජාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය අදියර ෂ හා ෂෂ යටතේ පළාත් පාලන ආයතන වෙත ලබාදෙන ලද සහායට අමතරව 2016 වසර තුළද මාතලේ මහ නගර සභාව හා වවුනියා නගර සභාව යන පළාත් පාලන ආයතනවලට ගිනිනිවීමේ යන්ත්‍රෝපකරණ ලබාදීමත්, කොළඹ / මාතලේ / යාපනය මහ නගර සභාවලට සහ වවුනියා / අම්පාර නගර සභාවලට ගිලන්රථ ලබාදීමත්, අවශ්‍ය අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමටත් කටයුතු කර ඇත.




ගිනි නිවන රථ හා ගිලන් රථ බෙදාදීම සංකේතවත් කරමින් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අතින් ඒවායේ යතුරු භාරදීම 2016 ජූලි මස 22 දින ජනාධිපති කාර්යාලයේදී සිදු කෙරිණි

මෙම අවස්ථාවට සහභාගී වූ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තාෆා, රාජ්‍ය අමාත්‍ය ප්‍රියංකර ජයරත්න, ලේකම් කමල් පද්මසිරි යන මහත්වරු ද මෙහි වෙති.

# 6.3.3.2. විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති

## 6.3.3.2.1. පුරනැගුම


**අරමුණ**


පළාත් පාලන ආයතන ක්‍රියාකාරකම් ප්‍රතිනිර්මාණය කිරීම සහ පසුගාමී පළාත් පාලන ආයතන බල ප්‍රදේශ 108ක් උප ව්‍යාපෘති 186ක් තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.





| | | |
|---|---|---|
| ණය ආධාර ලබාදෙන ආයතනය | ආසියානු සංවර්ධන බැංකුව | |
| ව්‍යාපෘති පිරිවැය (රු.මිලියන) | 8,160.00 | |
| ව්‍යාපෘති කාලය | 2011 - 2016 | |
| ක්‍රියාත්මක ප්‍රදේශ | බස්නාහිර, වයඹ, දකුණ, සබරගමුව, ඌව, මධ්‍යම, උතුරුමැද යන පළාත් | |
| සමස්ත භෞතික ප්‍රගතිය | 98% | |
| සමස්ත මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන) | 7249.00 | |
| 2016 ප්‍රතිපාදන රු.මි. | 3324.00 | |
| 2016 කාර්තුවට මූල්‍ය ඉලක්ක/ ප්‍රගතිය | 3324.00 | 2992. 00 |
| 2016 කාර්තුවට භෞතික ඉලක්ක/ ප්‍රගතිය | 100% | 98% |



| වගු අංක 8- පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වැඩසටහන් - 2016 | | | |
|---|---|---|---|
| **අනු අංකය** | **ව්‍යාපෘතියේ නම** | **ඉදිකිරීමට යෝජිත ප්‍රමාණය** | **වැඩ අවසන් කර ඇති ප්‍රමාණය** |
| 1 | සෞඛ්‍ය මධ්‍යස්ථාන | 31 | 30 |
| 2 | බස් නැවතුම්පොළ / වාහන නැවතුම්පොළ | 15 | 14 |
| 3 | පොදු ගොඩනැගිලි | 76 | 73 |
| 4 | සතිපොළ | 48 | 47 |
| 5 | දිවාසුරැකුම් මධ්‍යස්ථාන | 19 | 18 |
| 6 | පුස්තකාල | 39 | 38 |
| 7 | ජලයෝජනාක්‍රම | 21 | 07 |
| 8 | පහසු මධ්‍යස්ථාන | 12 | 28 |
| 9 | ආදාහනාගාර | 02 | 02 |
| 10 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති | 03 | 03 |
| 11 | මාර්ග / පාලම් | 23 | 22 |
| **එකතුව** | | **289** | **282** |

මූලාශ්‍රය ( පුරනැගුම ව්‍යාපෘතිය

මීට අමතරව ප්‍රාදේශීය සභා මඟින් සපයන සේවාවන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී අයුරින් ඉටුකිරීමට හැකිවන පරිදි එම ආයතන යටතේ පාලනය වන යටිතල පහසුකම් ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීම, වරිපනම් ඇතුළු අනෙකුත් බදු අය කිරීමේ හා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාපටිපාටි සරල කිරීම හා ඒවා අනුමත කිරීමේ ක්‍රමවේදය වඩාත් විනිවිදභාවයකින් ඉටුකිරීමට හැකිවන පරිදි ප්‍රාදේශීය සභාවන්හි ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීම මෙන්ම පළාත් පාලන ආයතන සඳහා යන්ත්‍රෝපකරණ බෙදාදීමත් සිදුකෙරේ.



නවගත්තේගම සතිපොළ



නාවුල බහුකාර්ය ගොඩනැගිල්ල


# 6.3.3.2.3. මහකොළඹ අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - අදියර 2 සහ 3


**අරමුණු**

කොළඹ නගරයේ අපජල පවාහන පද්ධතිය නවීකරණය කිරීම මගින් නගරයේ සහ අවට නගරවල ජීවත්වන නගරවැසියන් සඳහා ක්‍රමවත් අපජල පවාහන පද්ධතියක් ලබාදීම තුළින් ඔවුනට උචිත සෞඛ්‍ය සම්පන්න පරිසරයක් නිර්මාණය කිරීම.




| | | |
|---|---|---|
| අරමුදල් මූලාශ්‍රය | ආසියානු සංවර්ධන බැංකුව ශ්‍රී ලංකා රජය | |
| සමස්ත ව්‍යාපෘති පිරිවැය (රු.මි.) | 12,171.00 | |
| ව්‍යාපෘති කාලය | 2010 - 2017 | |
| ක්‍රියාත්මක ප්‍රදේශය | කොළඹ මහ නගර සභා බලප්‍රදේශය | |
| සමස්ත මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | 6,385.37 | |
| සමස්ත භෞතික ප්‍රගතිය | 65% | |
| 2016 ප්‍රතිපාදන රු.මි. | 1,030.00 | |
| 2016 සිව්වන කාර්තුවට මූල්‍ය ඉලක්ක/ ප්‍රගතිය | 302.74 | 331.80 |
| 2016 සිව්වන කාර්තු-වට භෞතික ඉලක්ක/ ප්‍රගතිය | 100% | 67% |



කොළඹ සහ අවට නගරවල ජීවත්වන 838,000 ක පමණ ජනතාව සඳහා උචිත සෞඛ්‍ය සම්පන්න පරිසරයක් නිර්මාණය කිරීම තුලින් යහපත් ජීවන තත්ත්වයක් ලබාදීමේ අරමුණින් සැලසුම් කෙරුණු මෙම ව්‍යාපෘතිය මගින් මහ කොළඹ ප්‍රදේශයේ මිලියන 2.5 ජනතාවට ප්‍රතිලාභ සැලසේ.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම කොළඹ මහා නගර සභාව මගින් සිදුකරන අතර, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය පරිපාලන කටයුතු සිදුකරයි. තාක්ෂණික, ආයතනික, කළමනාකරණ සහ මෙහෙයුම් දුෂ්කරතා යන ගැටළුවලට ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව ආයෝජනය කිරීමේ පදනමින් ව්‍යාපෘතිය සැලසුම් කර ඇත.

**ප්‍රධාන ක්‍රියාකාරකම්:**

1) කොළඹ මහා නගර සභා බලප්‍රදේශයෙහි අපජල පොම්පාගාර නවීකරණය කිරීම.
2) ධාරිතාවය අඩු හඳුනාගත් අපජලමාර්ග නවීකරණය කිරීම. අපජලය ගැඹුරු මුහුදට මුදාහරිනු ලබන ප්‍රධාන නළ මාර්ගයන් නවීකරණය කිරීම.
3) අපජල පවාහන පද්ධතිය නඩත්තු කිරීමට අවශ්‍ය යන්ත්‍රෝපකරණ කොළඹ මහ නගර සභා අපජල පවාහන අංශයට ලබාදීම
4) කොළඹ මහනගරසභාවේ අපජල අංශයේ කාර්යය මණ්ඩලයේ ආයතනික හා හැකියා සංවර්ධනය

**අපේක්ෂිත ප්‍රතිලාභ**

- අපජල කළමනාකරණ සේවය වැඩිදියුණු කිරීම මගින් ජීවත්වීමට සුදුසු නාගරික පරිසරයක් නිර්මාණය කිරීම.
- කොළඹ නගරය තුළ සහ තදාසන්න පෙදෙස්හි ජීවත්වන ජනතාවට සෞඛ්‍ය සම්පන්න පරිසරයක් නිර්මාණය කිරීම තුළින් යහපත් ජීවන තත්ත්වයක් ලබාදීම.
- සමුද්‍රීය සහ ගොඩබිම් ජලයේ තත්ත්වය උසස් කිරීම


වගු අංක 9 - මහකොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (2016-12-31ට ප්‍රගතිය)

| | ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|---|
| 01 | වැල්ලවත්ත හා මුතුවැල්ල පිහිටි අපජලය මුහුදට මුදාහරින නළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම | 100% |
| 02 | අපජල පවාහන නළ මාර්ගයේ ධාරිතාවය අඩු කි.මී.10ක ප්‍රමාණයේ ධාරිතාවය ඉහළ නැංවීම සහ කි.මී.125ක තත්ත්ව සමීක්ෂණය කිරීම | අපජල පවාහන පද්ධතියේ තත්ත්ව සමීක්ෂණ කිරීමේ දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා සිදුකරන CCTV සමීක්ෂණය හා පද්ධතිය පිරිසිදු කිරීම කි.මී. 92 ක දුර ප්‍රමාණය අවසන් කර ඇත. සමුද්‍ර මාවතෙහි සහ රජිණ මාවතෙහි කි.මී. 3.3 ක ප්‍රමාණයක් Micro tunneling තාක්ෂණය යොදාගනිමින් අපජල නළ නැවත එලීම අවසන් කර ඇත. |
| 03 | බන්ධනාගාරයේ සිදුවන නිරන්තර අපජල පිටාරගැලීම් සඳහා විසඳුමක් ලෙස සිදුකෙරෙන වනාතමුල්ල ප්‍රදේශයේ කි.මී.2ක අපජල නළ නවීකරණය කිරීම | සීවලී මාවතෙහි සහ සරණපාලහිමි මාවතෙහි මීටර් 662අපජල නළ එලා ඇති අතර, මනුබිල් 27ක ඉදිකිරීම් අවසන් කර ඇත. |
| 04 | කොළඹ නගර සහා බලප්‍රදේශය තුළ අපජල පවාහන පොම්පාගාර 11 ක් නවීකරණය කිරීම | ➢ පළමු කාණ්ඩයේ පොම්පාගාර 4ක මූලික සැලසුම් යෝජනා ඉදිරිපත් කර ඇත.<br>➢ වනාතමුල්ල පොම්පාගාරයේ කැණීම් හා Shoring වැඩ සිදුකරමින් පවතී.<br>➢ වනාතමුල්ල සහ බම්බලපිටිය පොම්පාගාරවල අපජලය විකල්ප මාර්ග ඔස්සේ බැහැර කිරීමේ විධිවිධාන සකසා අවසන් කර ඇත.අවසාන සවිස්තරාත්මක සැලසුම් වෙළුම් -2 ඉදිරිපත් කර ඇත.<br>➢ 1වැනි කට්ටලයේ සහ 2 වැනි කට්ටලයේ පොම්පාගාරවල සමීක්ෂණ කටයුතු අවසන් කර ඇති අතර, තිඹිරිගස්යාය, මාළිගාවත්ත, Vystwyke, බම්බලපිටිය පොම්පාගාරවල සහ අප ජල පවාහන අංශයේ වාහන අලුත්වැඩියා අංගනයේ මූලික සැලසුම් යෝජනා ඉදිරිපත් කර ඇත. |
| 05 | පාරිසරික අනුකූලතා ඇගයුම | විද්‍යාගාරයේ ඉදිකිරීම් අවසන්කර ඒ සඳහා අවශ්‍ය උපකරණ සපයා ඇත. |


# 6.3.3.2.2. මහකොළඹ අපජල කළමනාකරණ

| | | |
|---|---|---|
| **අරමුණු**<br>කොළඹ මහා නගර සහා සීමාව තුළ කාර්යක්ෂම හා අඛන්ඩ ජල සැපයුමක් සහ විධිමත් අපජල සේවාවක් ලබාදීම | | |
| අරමුදල් මූලාශ්‍රය | ආසියානු සංවර්ධන බැංකුව<br>ශ්‍රී ලංකා රජය | |
| සමස්ත ව්‍යාපෘති පිරිවැය (රු.මි.) | | |
| අදියර 2 | 1396.0 | |
| අදියර 3 | 26,061.00 | |
| ව්‍යාපෘති කාලය | | |
| අදියර 2 | 2014 - 2019 | |
| අදියර 3 | 2015 - 2020 | |
| ක්‍රියාත්මක ප්‍රදේශය | කොළඹ මහ නගර සහා බල ප්‍රදේශය | |
| සමස්ත මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | 42.21 | |
| සමස්ත භෞතික ප්‍රගතිය | 14% | |
| 2016 ප්‍රතිපාදන රු.මි.(අදියර 2) | 200.00 | |
| 2016 සිව්වන කාර්තුවට මූල්‍ය ඉලක්ක/ ප්‍රගතිය | 34.0 | 19.49 |
| 2016 සිව්වන කාර්තුවට භෞතික ඉලක්ක/ ප්‍රගතිය | 100% | 68.5% |

**2016.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය**




**2016.12.31 දිනට භෞතික ප්‍රගතිය**



කොළඹ මහා නගර සහා සීමාව තුළ කාර්යක්ෂම හා අඛණ්ඩ ජල සැපයුමක් සහ විධිමත් අපජල සේවාවක් ලබාදීම මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණ වැඩිදියුණුකිරීමේ ආයෝජන වැඩසටහනේ අපේක්ෂාවයි.

ආසියානු සංවර්ධන බැංකුවේ බහු කාර්යය සංවර්ධන ආයෝජන වැඩසටහන යටතේ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින කොළඹ අපජල පවාහන පද්ධතියේ අලුත්වැඩියා කටයුතු ඉදිරියට සිදු කිරීමට හා කොළඹ ප්‍රදේශයේ ජල හා අපජල පහසුකම් වැඩිදියුණු කිරීමට සැපයෙන මූල්‍ය ප්‍රතිපාදන මගින් කොළඹ දකුණ ප්‍රදේශයේ ඉදිරි නව සංවර්ධන කටයුතුවලට සරිලන පරිදි අපජල පවාහන පද්ධතියක් ස්ථාපිත කිරීම, දැනට අපජල පහසුකම් නොලබන ප්‍රදේශ සඳහා අපජල පවාහන පද්ධතියක් ස්ථාපිත කිරීම සහ අපජලය මුහුදට මුදා හැරීමට පෙර පිරිපහදු කිරීම සිදු කිරීමට අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා රජය මේ සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල්වලට අමතරව පරිපූරක අරමුදලක් යුරෝපානු ආයෝජන බැංකුවෙන් (ඇෂර්) ලබා ගැනීමට අපේක්ෂා කරයි.

වගු අංක 10 - මහකොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - අදියර 2 (2016-12-31ට ප්‍රගතිය)

| අංකය | ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|---|
| 01. | අපජල පවාහන පද්ධතියේ කි මි 125ක් CCTV සමීක්ෂණ හා පිරිසිදු කිරීම මගින් තත්ත්ව සමීක්ෂණ කිරීම. | තාක්ෂණික ඇගයුම් කමිටුව විසින් ප්‍රසම්පාදන ලිපිගොණු ඇගයීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. |
| 02. | දැනට කොළඹ කිරුළපන ප්‍රදේශයේ අපජල පහසුකම් නොලබන ප්‍රදේශය ආවරණය වන පරිදි කි මි 29.40ක් දුර අපජල නළ පද්ධතියක් හා පොම්පාගාර 3 ක් ඉදි කිරීම. | මූල්‍ය ඇගයීම් සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය ලබා ගෙන ඇත. අභියාචනා ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. |
| 03. | කි මි 15.61 අපජල නළ අලුත්වැඩියා කිරීම, නැවත එලීම හා පිරිසිදු කිරීම තුළින් කොළඹ දකුණ අපජල පෝෂිත ප්‍රදේශයේ දැනට පවතින අපජල පද්ධතියේ අපජල නළ බිඳ වැටීම් අවහිරතා සහ රොන්මඩ හා වැලි ඒකරාශීවීම් හඳුනා ගැනීම හා පිළියම් යෙදීම | ප්‍රසම්පාදන ලියකියවිලි ඇගයීම සිදු වෙමින් පවතී. |
| 04. | කොළඹ දකුණ අපජල පෝෂිත ප්‍රදේශයේ කි මි 6.22 ක් දිග අපජල පවාහන පද්ධතිය සහ පොම්පාගාර 3 ක් ඉදිකිරීම. | පස් නියැදි සාම්පල් විමර්ශණය, |
| 05. | සැලසුම් ඉදිකිරීම් සහ ක්‍රියාකිරීම් ක්‍රමවේදය යටතේ දිනකට ඝණ මීටර් 50,000 ක ධරිතාවයෙන් යුතු ද්වීතිය අපජල පිරිපහදු කර්මාන්ත ශාලාවක් වැල්ලවත්ත ප්‍රදේශයේ ඉදිකිරීම. | ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු, අපජල පවාහන පද්ධතිය සහ පොම්පාගාර සැලසුම් කිරීම සිදු වෙමින් පවතී. |

| | |
|---|---|
|  |  |
| Micro tunneling තාක්ෂණය යොදාගනිමින් අපජල නළ එලීම | වනාතමුල්ල අපජල නළ නවීකරණය කිරීම |
|  |  |
| අපජල පවාහන පද්ධතිය CCTV තත්ත්ව සමීක්ෂණ කිරීම | වනාතමුල්ල පොම්පාගාරයේ කැණීම් කටයුතු සිදුකරන අයුරු |

මූලාශ්‍රය - මහකොළඹ අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - අදියර 2 2


# 6.3.3.2.4. උතුරු පළාත් මාර්ග සම්බන්ධිත ව්‍යාපෘතිය (ආරම්භක)


**අරමුණු**

උතුරු පළාත තුළ වව්නියාව සහ මන්නාරම දිස්ත්‍රික්ක දෙකෙහි මාර්ග ජාලය වැඩිදියුණු කිරීම මගින් පළාත තුළ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සහ උතුරු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම



| | | |
|---|---|---|
| ණය ආධාර ලබාදෙන ආයතනය | ආසියානු සංවර්ධන බැංකුව | |
| ව්‍යාපෘති පිරිවැය (රු.මිලියන) | 3600.00 | |
| ව්‍යාපෘති කාලය | 2010 - 2016 | |
| ක්‍රියාත්මක ප්‍රදේශ | උතුරු පළාත | |
| සමස්ත භෞතික ප්‍රගතිය | 100% | |
| සමස්ත මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන) | 3132.73 | |
| 2016 ප්‍රතිපාදන රු.මි. | 749.43 | |
| 2016 සිව්වන කාර්තුවට මූල්‍ය ඉලක්ක/ ප්‍රගතිය | 560.31 | 414.62 |
| 2016 සිව්වන කාර්තු-වට භෞතික ඉලක්ක/ ප්‍රගතිය | 90% | 95% |




ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම මත ආසියානු සංවර්ධන බැංකුව විසින් ඇ.ඩො. මිලියන 173 ක ණය ආධාරයක් දිවයිනේ උතුරු කොටසේ තෝරාගත් ජාතික හා පළාත් මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා ලබාදී ඇත . එයින් ඇ.ඩො. මිලියන 24.4ක් පළාත් සංරචකය යටතේ උතුරු පළාතේ පළාත් තෝරාගත් මාර්ග කි.මී. 154 පුනරුත්ථාපනය කිරීම සඳහා සහ උතුරු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම සඳහා යොදාගැනීමට අපේක්ෂා කෙරේ.

**ක්‍රියාත්මක කිරීමේ ආයතන**

උතුරු පළාතේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව


**භෞතික ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතියේ පළාත් සංරචකය යටතේ උතුරු පළාතේ මාර්ග කොන්ත්‍රාත් 08ක් සහ ගොඩනැගිලි කොන්ත්‍රාත් 01 පිරිනමා ඇති අතර, එයින් මාර්ග කොන්ත්‍රාත් 06 ක් සහ ගොඩනැගිලි කොන්ත්‍රාත්තුවේ වැඩ නිම කර ඇත. ඉතිරි මාර්ග කොන්ත්‍රාත් 02 හි ඉදිකිරීම් සිදුවෙමින් පවතී.

වගු අංක 11- ප්‍රගතිය - උතුරු පළාත් මාර්ග සම්බන්ධිත ව්‍යාපෘතිය (ආරම්භක)
(2010-12-31 දිනට)

| | ආරම්භක කොන්ත්‍රාත් වටිනාකම රු.මි. | සංශෝධිත BOQ අවටිනාකම රු.මි. | සත්‍ය වියදම රු.මි. | මූල්‍ය ප්‍රගතිය % | ව්‍යාපෘති කාලය | | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ආරම්භක දිනය | අවසන් කළ දිනය | ඉලක්ක % | සත්‍ය % |
| මාර්ග | 414.06 | 457.93 | 437.12 | 95.46% | 2011-10-02 | 21/06/2013 | 100% | 100% |
| | 413.23 | 454.72 | 448.03 | 98.53% | 2011-11-02 | 31/05/2014 | Mutually Terminated | |
| | 371.68 | 378.32 | 358.13 | 94.67% | 2011-10-02 | 31/05/2014 | 100% | 100% |
| | 345.54 | 345.54 | 262.28 | 75.90% | 24/02/2015 | 31/07/2016 | 100% | 98% |
| | 507.69 | 507.69 | 342.66 | 67.49% | 16/03/2015 | 30/09/2016 | 75% | 91% |
| | 351.92 | 351.92 | 312.40 | 88.77% | 2011-10-02 | 31/05/2014 | 100% | 100% |
| | 390.64 | 448.44 | 419.06 | 93.45% | 2011-10-02 | 31/05/2014 | 100% | 100% |
| | 355.42 | 279.11 | 263.37 | 94.36% | 2011-10-02 | 31/05/2014 | 100% | 100% |
| ගොඩනැගිලි | 76.69 | 76.69 | 65.48 | 85.39% | 2014-10-06 | 2015-09-06 | 100% | 100% |
| **එකතුව** | **3,227** | **3,300** | **2,908.53** | | | | | |

මූලාශ්‍රය-උතුරු පළාත් මාර්ග සම්බන්ධිත ව්‍යාපෘතිය(ආරම්භක)



මහිලන්කුලම-පල්ලමඩු පාර-පාලම් සකස් කිරීම



උයිලන්කුලම-මානකුලම්-නනද්දන් පාර බෝක්කු ඉදිකිරීම



මඩුකන්ද-ඊරටපෙරියකුලම් පාර



උයිලන්කුලම-මානකුලම්-නන්ද්දන් පාර බෝක්කු ඉදිකිරීම


# 6.3.3.2.5. උතුරු පළාත් මාර්ග සම්බන්ධිත ව්‍යාපෘතිය (අතිරේක ප්‍රතිපාදන)


**අරමුණු**

උතුරු පළාත තුළ කිළිනොච්චිය සහ මුලතිව් දිස්ත්‍රික්ක දෙකෙහි සහ උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ මාර්ග ජාලය වැඩිදියුණු කිරීම මගින් පළාත තුළ අභ්‍යන්තර සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සහ පළාත් මාර්ග සංවර්ධන ආයතනයන් ශක්තිමත් කිරීම.



| | | |
|---|---|---|
| ණය ආධාර ලබාදෙන ආයතනය | ආසියානු සංවර්ධන බැංකුව | |
| ව්‍යාපෘති පිරිවැය (රු.මිලියන) | 4,600.00 | |
| ව්‍යාපෘති කාලය | 2013 - 2018 | |
| ක්‍රියාත්මක ප්‍රදේශ | උතුරුසහඋතුරුමැදපළාත | |
| සමස්ත භෞතික ප්‍රගතිය | 90.9% | |
| සමස්ත මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන) | 3,327.86 | |
| 2016 ප්‍රතිපාදන :රු.මිලියන | 1,485.58 | |
| 2016 කාර්තුවට මූල්‍ය ඉලක්ක/ ප්‍රගතිය | 1,485.58 | 993.16 |
| 2016 කාර්තුවට භෞතික ඉලක්ක/ ප්‍රගතිය | 100% | 67% |




මුල් ව්‍යාපෘතියේ සාර්ථකත්වය පදනම්ව ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම මත ආසියානු සංවර්ධන බැංකුව විසින් උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතියට අතිරේක මූල්‍යයයක් ලෙස ඇ.ඩො. මිලියන 68ක ණය ආධාරයක් දිවයිනේ

උතුරු කොටසේ තෝරා ගත් ජාතික හා පළාත් මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා ලබා දී ඇත. එයින් ඇ.ඩො. මිලියන 30 ක් පළාත් සංරචකය යටතේ උතුරු සහ උතුරුමැද පළාත්වල තෝරාගත් පළාත් මාර්ග කි.මී. 125 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා සහ උතුරු සහ උතුරුමැද පළාත් මාර්ග ආයතනයන් ශක්තිමත් කිරීම සඳහා යොදාගැනීමට කටයුතු කෙරේ.

**ක්‍රියාත්මක කිරීමේ ආයතනය**

උතුරු පළාතේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව සහ උතුරුමැද පළාතේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

**භෞතික ප්‍රගතිය**

අතිරේක මූල්‍යනය යටතේ උතුරුමැද පළාතේ මාර්ග කොන්ත්‍රාත් 05ක් ද උතුරු පළාතේ මාර්ග කොන්ත්‍රාත් 04 ක් ද පිරිනමා ඇත. එයින් උතුරු මැද පළාතේ කොන්ත්‍රාත් 05 ම නිමකර ඇති අතර, උතුරු පළාතේ කොන්ත්‍රාත් 02ක් නිම කර ඇත. මෙම නිම කරන ලද කොන්ත්‍රාත්තුවල අවුරුදු 05 ක කාලයක් සඳහා එම මාර්ග නඩත්තු කටයුතු අදාල කොන්ත්‍රාත්කරුවන් විසින්ම ඉදිරියට කරගෙන යාමට නියමිතව ඇත. උතුරු පළාතේ ඉතිරි කොන්ත්‍රාත් 02 හි ඉදිකිරීම් සිදුවෙමින් පවතී.

වගු අංක 12 - දැනට ක්‍රියාත්මක මාර්ගවල ප්‍රගතිය, උතුරු පළාත් මාර්ග සම්බන්ධිත ව්‍යාපෘතිය (අතිරේක ප්‍රතිපාදන)


| පළාත | දිස්ත්‍රික්කය | මාර්ගයේ නම | දිග ප්‍රමාණය (කි.මී.) | ඇස්ත මේන්තුව රු.මි. | වියදම රු.මි. | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | ඉලක්කය | ප්‍රගතිය % |
| උතුරු | කිලිනොච්චි | එල්.බී. ප්‍රධාන මාර්ගය, අක්කරයාන්කුලම මාර්ගය (කි.මී.7.06), ආර්.බී. ප්‍රධාන මාර්ගය, අක්කරයාන්කුලම (කි.මී. 6.6) | 13.66 | 473.19 | 278.47 | 58.85 | 100 | 62.5 |
| | මුලතිව් | වට්ටපලායි-කෙප්පායිපිලව් පුදුකුඩියිරුප්පු මාර්ගය | 12.85 | 647.63 | 467.59 | 72.0 | 57 | 56.0 |
| **එකතුව** | | | **26.51** | **1,120.82** | **467.59** | | | |

මූලාශ්‍රය- උතුරු පළාත් මාර්ග සම්බන්ධිත ව්‍යාපෘතිය(අතිරේක ප්‍රතිපාදන)


| | |
|---|---|
|  |  |
| කෙන්නඩි පාර | ඔඩ්ඩුසුඩාන්-පුදුකුඩිරිප්පු මාතලන් පාර |


# 6.3.3.2.5. යාපනය - කිලිනොච්චි ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය

අරමුණු
- යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල ජල සැපයුම් සේවා වැඩිදියුණු කිරීම
- යාපනය මහ නගර සභා සීමාව තුළ ජනතාව සඳහා සනීපාරක්ෂක යටිතල පහසුකම් හා යාපනය අර්ධද්වීපයේ ජල සැපයුම් කළමනාකරණ වැඩසටහන් ශක්තිමත් කිරීම



| | | |
|---|---|---|
| ණයආධාරලබාදෙන- ආයතනය | ආසියානු සංවර්ධන බැංකුව | |
| ව්‍යාපෘති පිරිවැය (රු.මිලියන) | 2,198.30 | |
| ව්‍යාපෘති කාලය | 2012 - 2017 | |
| ක්‍රියාත්මක ප්‍රදේශ | කිලිනොච්චිය දිස්ත්‍රික්ක | |
| සමස්ත භෞතික ප්‍රගතිය | 40% | |
| සමස්ත මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන) | 802.01 | |
| 2016 ප්‍රතිපාදන :රු.මිලියන | 700.00 | |
| 2016 සිව්වන කාර්තුවට මූල්‍ය ඉලක්ක/ ප්‍රගතිය | 700.00 | 418.73 |
| 2016 සිව්වන කාර්තුවට භෞතික ඉලක්ක ප්‍රගතිය | 100% | 40% |



මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලය වන්නේ පළල් කරමින් ප්‍රතිසංස්කරණය කරන ලද ඉරණමඩු ජලාශය හා ඉරණමඩු ජලාශය යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද උත්සාන වාරිමාර්ග ක්‍රමය වේ.

මේ යටතේ ගොවිපවුල් 10,000කට පමණ ප්‍රතිලාභ සැලසෙන අතර වගා කළ හැකි ප්‍රමාණය හෙක්ටයාර් 8455කි. තිරුවයිආරු උත්සාන වාරිමාර්ග යෝජනා ක්‍රමය යටතේ හෙක්ටයාර් 447ක් වගා කළ හැකි නමුත් යුදගැටුම් සමයේ සිට එය ක්‍රියාත්මක නොවේ. මේ ව්‍යාපෘතිය මගින් යල කන්නයේ වගා කෙරෙන කුඹුරු ප්‍රමාණය අක්කර 4000කින් පමණ වැඩිකිරීමට හැකිවනු ඇති බවට ගණන් බලා ඇත.


# 6.3.3.2.6. ද්විතීයික සෞඛ්‍ය අංශික සංවර්ධන ව්‍යාපෘතිය


**අරමුණු**

යපෝෂණය සහ බෝනොවන රෝග සම්බන්ධයෙන් පැනනගින අභියෝගයන්ට සාර්ථකව මුහුණදීමට හැකිවන පරිදි මහජන සෞඛ්‍ය පහසුකම් නංවාලීම



| | | |
|---|---|---|
| ණය ආධාර ලබාදෙන ආයතනය | ලෝකබැංකුව | |
| ව්‍යාපෘති පිරිවැය | රු.මි. 26,000 | |
| ව්‍යාපෘති කාලය | 2013 - 2018 | |
| ක්‍රියාත්මක ප්‍රදේශ | සමස්ත දිවයින පුරා | |
| සමස්ත භෞතික ප්‍රගතිය | 62% | |
| සමස්ත මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන) | 5,853.90 | |
| 2016 ප්‍රතිපාදන (රු.මිලියන) | 3,306.00 | |
| 2016 සිව්වන කාර්තුවට මූල්‍ය ඉලක්ක/ ප්‍රගතිය | 3,306.00 | 3,285.50 |
| 2016 සිව්වන කාර්තුවට භෞතික ඉලක්ක ප්‍රගතිය | 100% | 90% |



ව්‍යාපෘති කාර්යයන් ඃ

- බෝනොවන රෝග වැළැක්වීම සහ පාලනය සඳහා කටයුතු කිරීම
- මාතෘ සහ ළමා සෞඛ්‍ය හා පෝෂණය සඳහා කටයුතු කිරීම
- බෝවන රෝග වැළැක්වීම සහ පාලනය සඳහා කටයුතු කිරීම
- සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීම
- පුහුණු වැඩමුළු, පර්යේෂණ සහ සමීක්ෂණ







# 6.3.3.2.7. ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

අරමුණු

1) රටේ ජාතික ආර්ථික වර්ධනය අරමුණු කරගනිමින් ජනතාවගේ සංචලනය සහ ජීවන තත්ත්වයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම
2) ග්‍රාමීය ජනතාවගේ පොදු සුරක්ෂිත බව වර්ධනය කිරීම
3) ග්‍රාමීය ප්‍රදේශවල මෙතෙක් භාවිතයට නොගත් සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම මෙන්ම ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීම අරමුණු කරගනිමින් නව නිෂ්පාදන අවස්ථා සඳහා ඔවුන්ගේ දේශීය දැනුම භාවිතයට ගැනීම

| | | අදියර 1 | අදියර 11 | අදියර 111 |
|---|---|---|---|---|
|  | ණය ආධාර ලබාදෙන ආයතනය | එක්සත් රාජධානිය | එක්සත් රාජධානිය | නෙදර්ලන්තය |
| | ව්‍යාපෘති පිරිවැය (රු.මිලියන) | 7400.0 | 20,200.00 | 16,500.00 |
| | ව්‍යාපෘති කාලය | 2013 - 2015 | 2014 - 2017 | 2014 - 2017 |
| | ක්‍රියාත්මක ප්‍රදේශ | සමස්ත දිවයින පුරා | | |
| | සමස්ත භෞතික ප්‍රගතිය | 100% | 64% | 50% |
| | සමස්ත මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | 7,357.19 | 14,592.30 | 12,164.30 |
| 2016 සිව්වන කාර්තුවට මූල්‍ය ඉලක්ක/ ප්‍රගතිය | | 11,697.0 | | 8,932.58 |
| 2016 සිව්වන කාර්තුවට භෞතික ඉලක්ක ප්‍රගතිය | | 100% | | 44% |



| වගු අංක 13 - ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (ප්‍රගතිය 2013 - 2016) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| මූල්‍ය සහාය | මුළු පිරිවැය | 2016 සඳහා වෙන්කළ ප්‍රතිපාදන රු.මි. | ඉදිකෙ-රෙන පාලම් සංඛ්‍යාව | වැඩ නිමි සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය (2016) රු.මි. | සමස්ත මූල්‍ය ප්‍රගතිය රු.මි. | සමස්ත භෞතික ප්‍රගතිය % |
| එක්සත් රා-ජධානිය | 7400.00 | 567.0 | 210 | 210 | 553.84 | 7351.19 | 100 |
| එක්සත් රා-ජධානිය | 20,200.00 | 5520.0 | 537 | 208 | 5223.59 | 14592.30 | 64 |
| නෙදර්ලන්තය | 16,500.00 | 5610.0 | 463 | 110 | 5198.41 | 12164.38 | 50 |
| | **44,100.00** | **11,697.00** | **1,210.00** | **528** | **8932.58** | **32064.91** | |

මූලාශ්‍රය- ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

මේ ව්‍යාපෘතියෙහි පළමු අදිරෙහි වැඩ අවසන් වී ඇත. දෙවන අදියර යටතේ වැඩ අවසන් නොවූ පාලම් 329හි සහ තෙවන අදියර යටතේ වැඩ අවසන් නොවූ පාලම් 353ක ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී.



පෙර



පසු

කුරගම්මන හා පොලගම පාලම-මොනරාගල-බිබිල



පෙර



පසු

හඳුගල ජබරකැටිය හරස් පාලම


# 6.3.3.2.8. උතුරු නැගෙනහිර පළාත් පාලන සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - (NELSIP)


**අරමුණු**

උතුරු, නැගෙනහිර පළාත් සහ ඒවාට යාබදව පිහිටි ඌව, වයඹ හා උතුරුමැද පළාත්වල පළාත් පාලන ආයතනවලට ස්වකීය සේවාවන් හා ප්‍රාදේශීය යටිතල පහසුකම් වගකීම හා වගවීම සහිතව මහජනයා වෙත ලබාදීම සඳහා සහාය වීම

| | | |
|---|---|---|
|  | ණය ආධාර ලබාදෙන ආයතන | ලෝකබැංකුව, ඕස්ට්‍රේලියානු රජය හා ශ්‍රී ලංකා රජය |
| | සමස්ත ව්‍යාපෘති පිරිවැය (රු.මිලියන) | 13,522.90 |
| | ව්‍යාපෘති කාලය | 2012 - 2017 |
| | ක්‍රියාත්මක ප්‍රදේශ<br>➢ උතුරු නැගෙනහිර සියලු පළාත් පාලන ආයතන - 79<br>➢ උතුරු මැද පළාතේ පළාත් පාලන ආයතන - 12<br>➢ ඌව පළාතේ මොනරාගල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන - 03<br>➢ වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන - 07 | |
| | සමස්ත භෞතික ප්‍රගතිය | 88% |

| | | |
|---|---|---|
| සමස්ත මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන) | 12,936.24 ( 95%) | |
| 2016 සිව්වන කාර්තුවට මූල්‍ය ඉලක්ක/ ප්‍රගතිය (රු.මිලියන) | 3,050.00 | 3,098.79 |
| 2016 සිව්වන කාර්තුවට භෞතික ඉලක්ක ප්‍රගතිය (රු.මිලියන) | 100% | 90% |



ප්‍රධාන සංරචක

1. යටිතල සේවා සැපයුම

   පළාත් පාලන ආයතන විසින් පවත්වාගෙන යන හා සපයනු ලබන සේවාවන් ප්‍රමාණාත්මක හා ගුණාත්මක ලෙස වැඩිදියුණු කිරීම

2. වගවීම් ආයතන ගත කිරීම

   පළාත් පාලන ආයතනවල වගකීම් තහවුරු කිරීම, පොදු ස්ථාන සඳහා සමාජීය හා තාක්ෂණික විගණන පැවැත්වීම, පොදු ව්‍යාපෘති සැලසුම් කිරීම, පසුවිපරම් කිරීම හා අධීක්ෂණය කිරීම.

3. ධාරිතා වර්ධනය

   ප්‍රාදේශීය සේවා සැපයීම ශක්තිමත් කිරීම හා පළාත් පාලන ආයතන වලට පැවරී ඇති සේවා සැපයීම සඳහා එම ආයතනවල හැකියාව ගොඩනැගීම සහ ඒ සඳහා වූ පළාත් හා ජාතික මට්ටමේ ආයතන වල අධීක්ෂණ ධාරිතාවය ශක්තිමත් කිරීම.

4. ඇගයීම හා තක්සේරුකරණය

   පළාත් පාලනයට අදාල ඵලදායී ප්‍රතිපත්ති සැකසීම සඳහා හැකියාව වැඩි දියුණු කර ගැනීම අරමුණු කර ගත් විවිධ විශ්ලේෂණ හා උපදේශන ක්‍රියාකාරකම්

5. ව්‍යාපෘති කළමණාකරණය

   ව්‍යාපෘතියේ සුගම ක්‍රියාකාරීත්වය සඳහා දෛනික කළමණාකරණ කටයුතුවල නිරත රජයේ හා පළාත් ආයතනවලට අවශ්‍ය උපදේශන සේවා සහ උපකරණ මිලදී ගැනීම සඳහා සහය විම

වගු අංක 14 - උතුරු- නැගෙනහිර පළාත් පාලන සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය<br>අරමුදල් මූලාශ්‍ර

| මුදල් මූලාශ්‍ර | ව්‍යාපෘති මුදල | | සංශෝධිත ව්‍යාපෘති මුදල | |
|---|---|---|---|---|
| | ඇ. ඩො | රු. මි. | ඇ. ඩො | රු. මි. |
| ජාත්‍යන්තර සහයෝගිතා අරමුදල(WB) | 50.00 | 6,175.00 | 70.00 | 9,215.40 |
| විදේශ කටයුතු හා වෙළෙඳ දෙපාර්තමේන්තු (AusAid) | 20.30 | 2,537.50 | 20.30 | 2,537.50 |
| ශ්‍රී ලංකා රජය | 34.00 | 3,740.00 | 14.00 | 1,550.00 |
| ප්‍රජා දායකත්වය | 2.00 | 220.00 | 2.00 | 220.00 |
| මුළු මුදල | 106.30 | 12,672.50 | 106.30 | 13,522.90 |

මූලාශ්‍රය- උතුරු-නැගෙනහිර පළාත් පාලන සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

වගු අංක 15- සමස්ත මූල්‍ය ප්‍රගතිය<br>උතුරු-නැගෙනහිර පළාත් පාලන සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (2016 -12-31 දිනට)

| සංරචකය | මුළු ඇස්තමේන්තුව රු.මි. | වියදම රු.මි. |
|---|---|---|
| යටිතල සේවා සැපයුම | 11,334.05 | 10,653.79 |
| වගවීම් ආයතන ගත කිරීම | 46.00 | 36.55 |
| ධාරිතා වර්ධනය | 1,803.50 | 1457.57 |
| ඇගයීම හා තක්සේරුකරණය | 51.5 | 14.01 |
| ව්‍යාපෘති කළමණාකරණය | 287.85 | 263.52 |
| එකතුව | 13,522.90 | 12,425.44 |

වගු අංක 16 - 2016 අනුමත උප ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය

| පළාත | දිස්ත්‍රික්කය | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | භෞතික ප්‍රගතිය | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | 0-25% | 26-50% | 51-75% | 76-99% | 100% |
| උතුරු | යාපනය | 54 | 0 | 5 | 7 | 6 | 35 |
| | මන්නාරම | 15 | 0 | 0 | 0 | 5 | 10 |
| | කිලිනොච්චි | 9 | 0 | 0 | 3 | 0 | 6 |
| | වවුනියා | 13 | 0 | 0 | 6 | 3 | 4 |
| | මුලතිවු | 12 | 0 | 0 | 2 | 9 | 2 |
| **උප එකතුව** | | 103 | 0 | 5 | 18 | 23 | 57 |
| නැගෙනහිර | මඩකලපුව | 34 | 1 | 5 | 8 | 7 | 10 |
| | ත්‍රිකුණාමලය | 57 | 2 | 5 | 15 | 24 | 15 |
| | අම්පාර | 75 | 1 | 1 | 10 | 8 | 54 |
| උප එකතුව | | 166 | 4 | 11 | 33 | 39 | 79 |
| උතුරු මැද | අනුරාධපුර | 26 | 0 | 0 | 0 | 5 | 21 |
| | පොලොන්නනරුව | 6 | 0 | 0 | 0 | 4 | 2 |
| **උප එකතුව** | | 32 | 0 | 0 | 0 | 9 | 23 |
| වයඹ | පුත්තලම | 10 | 1 | 1 | 7 | 4 | 6 |
| උප එකතුව | | 10 | 1 | 1 | 7 | 4 | 6 |
| ඌව | මොනරාගල | 8 | 0 | 0 | 8 | 3 | 5 |
| **උප එකතුව** | | 8 | 0 | 0 | 8 | 3 | 5 |
| එකතුව | | 319 | 5 | 17 | 66 | 78 | 170 |

බුත්තල මහජන පුස්තකාලය ඉදිකිරීම-රු.මි.21.4



ඩෙල්ෆ්ට් දූපත සඳහා මගී ප්‍රවාහන බෝට්ටුවක් ඉදිකිරීම -රු.මි.150





අනුරාධපුර නාගසේන මාවත කාණු පද්ධතිය ඉදිකිරීම-රු.මි. 39.95



අම්පාර බස්නැවතුම්පොළ ඉදිකිරීම රු.මි. 280.0


# 6.3.3.2.9. දැනුම් කේන්ද්‍රයේ පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය පරිණාමනය කිරීමේ ව්‍යාපෘතිය


**අරමුණු**

දැනුම පාදක කරගත් ආර්ථික හා සමාජීය සංවර්ධනයේ පදනම ලෙස ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය කෙරෙහි වූ ප්‍රවේශය හා එහි ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කිරීම



| | | |
|---|---|---|
| ණය ආධාර ලබාදෙන ආයතනය | ලෝකබැංකුව | |
| ව්‍යාපෘති පිරිවැය (රු.මිලියන) | 13,000.00 | |
| ව්‍යාපෘති කාලය | 2012 - 2017 | |
| ක්‍රියාත්මක ප්‍රදේශ | සමස්ත දිවයින පුරා | |
| සමස්ත භෞතික ප්‍රගතිය | 91% | |
| සමස්ත මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන) | 11,098.00 | |
| 2016 ප්‍රතිපාදන (රු.මිලියන) | 3800.00 | |
| 2016 සිව්වන කාර්තුවට මූල්‍ය ඉලක්ක/ ප්‍රගතිය | 3,800.00 | 2,363.00 |
| 2016 සිව්වන කාර්තුවට භෞතික ඉලක්ක/ ප්‍රගතිය | 100% | 79% |



අධ්‍යාපනය යනු රටක සංවර්ධනයේ මූලික පදනමයි. රටක ආර්ථික හා සමාජීය දියුණුව ළඟා කරගත හැක්කේ අධ්‍යාපනය මගිනි. එබැවින් මෙම ව්‍යාපෘතිය මගින් පුරවැසියන් උගතුන් ලෙස බලායනය කිරීම සඳහා පහසුකම් සැපයීම සිදුකරයි. පාසල් පාදක ගුරු සංවර්ධනය, ද්විභාෂා අධ්‍යාපනය ඉහල නැංවීම, පාසල් සංවර්ධන කමිටු සහ පාසල් කළමණාකරන කමිටු සියලු පාසල්වල ඇති කිරීම, රටේ අධ්‍යාපනය සංවර්ධන කිරීම සහ අධ්‍යාපනය කළමණාකරණය ශක්තිමත් කිරීම මෙම ව්‍යාපෘතිය මගින් බලාපොරොත්තු වේ.

වගු අංක 17 - දැනුම් කේන්ද්‍රයේ පදනම ෙ,ස පාස; අධ්‍යාපන පද්ධතිය පරිණාමනය කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම්

| | ක්‍රියාකාරකම් | සංඛ්‍යාව |
|---|---|---|
| 1. | පන්ති කාමර ගොඩනැගිලි ඉදිකිරීම | 178 |
| 2. | පන්ති කාමර ගොඩනැගිලි අලුත්වැඩියාව | 92 |
| 3. | කලාප අධ්‍යාපන කාර්යාල ඉදිකිරීම | 14 |
| 4. | කලාප අධ්‍යාපන කාර්යාල අලුත්වැඩියාව | 12 |
| 5. | කොට්ඨාස අධ්‍යාපන කාර්යාල ඉදිකිරීම | 22 |
| 6. | කොට්ඨාස අධ්‍යාපන කාර්යාල අලුත්වැඩියාව | 21 |
| 7. | පාසැල්/කලාප/කොට්ඨාස අධ්‍යාපන කාර්යාල සඳහා පරිගණක ලබාදීම | 2719 |
| 8. | පරිගණක උපාංග ලබාදීම (ස්කැනර්, ප්‍රින්ටර් ආදී) | 2039 |
| 9. | පන්තිකාමර ලී බඩු උපකරණ ලබාදීම | 56,318 |
| 10. | කාර්යාලීය ලී බඩු උපකරණ ලබාදීම | 8366 |
| 11. | මෝටර් වාහන ලබාදීම | 20 |
| 12. | කාර්යාල උපකරණ (ඡායා පිටපත්, ෆැක්ස්, මල්ටිමීඩියා ආදී) | 782 |
| 13. | විද්‍යාගාර, ගෘහ විද්‍යාගාර හා ක්‍රීඩා උපකරණ ලබාදීම | 290,495 |

මූලාශ්‍රය-දැනුම් කේන්ද්‍රයේ පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය පරිණාමනය කිරීමේ ව්‍යාපෘතිය



ගෘහ ආර්ථික ඒකකය-
ඊරියගොල්ල මහා විද්‍යාලය-යක්විල-වයඹ පළාත



නුවරඑළිය කොට්ටාස අධ්‍යාපන කාර්යාලය
මධ්‍යම පළාත


# 6.3.3.2.10. ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය


**අරමුණු**

වාරිමාර්ග යටිතල පහසුකම් ඵලදායි හා තිරසාර කළමනාකරණයක් සඳහා දියුණු කිරීම සහ ජල හා භූමි ඵලදායිතාවය තිරසාර ලෙස දියුණු කිරීම



| | | |
|---|---|---|
| ණය ආධාර ලබාදෙන ආයතනය | කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තරඅරමුදල(IFAD) | |
| ව්‍යාපෘති පිරිවැය (රු.මිලියන) | 3,200.00 | |
| ව්‍යාපෘති කාලය | 2012 - 2017 | |
| ක්‍රියාත්මක ප්‍රදේශ | උතුරු පළාතේ කිළිනොච්චි දිස්ත්‍රික්කය (වාරිමාර්ග කිලෝමීටර් 390) | |
| ව්‍යාපෘති ක්‍රියාකාරකම්<br>1 යටිතල පහසුකම් සංවර්ධනය<br>➢ වාර්මාර්ග පුනරුත්ථාපනය<br>➢ අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය<br>2 නිෂ්පාදනය සහ අලෙවිකරණ කටයුතු ප්‍රවර්ධනය<br>3 ව්‍යාපෘති කළමනාකරණය | | |
| සමස්ත භෞතික ප්‍රගතිය | 84% | |
| සමස්ත මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන) | 2314.44 | |
| 2016 ප්‍රතිපාදන :(රු.මිලියන) | 1250.00 | |
| 2016 සිව්වන කාර්තුවට මල්‍ය ඉලක්ක/ ප්‍රගතිය | 900.00 | 985.80 |
| 2016 සිව්වන කාර්තුවට භෞතික ඉලක්ක/ ප්‍රගතිය | 100% | 84% |



| වගු අංක 18 - මූල්‍ය ප්‍රගතිය - ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අරමුදල් මූලාශ්‍රය | සමුච්ඡිත වියදම රු.මි. | | | 2016 වර්ෂයේ ප්‍රතිපාදන හා වියදම රු.මි. | | | |
| | මුළු ඇස්තමේන්තුව | සමුච්ඡිත වියදම 2016 දෙසැම්බර් මාසයට රු.මි. | % | 2016 ප්‍රතිපාදන රු.මි. | ගිවිසුම්ගත රු.මි. | වියදම 2016 දෙසැම්බර් මාසයට රු.මි. | % |
| IFAD | 2865.00 | 2315.22 | 80.8 | 1125 | 900.00 | 117.26 | 99.3 |
| GOSL | 335.00 | 249.42 | 74.4 | 125.0 | 100.00 | 118.18 | 94.5 |
| එකතුව | 3200.00 | 2564.64 | 80.4 | 1250.0 | 1000.00 | 1235.44 | 98.8 |

මූලාශ්‍රය- ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

| වගු අංක 19 - භෞතික ප්‍රගතිය-ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | | | | | |
|---|---|---|---|---|---|
| වාරිමාර්. යටිතල පහසුකම් | ඒකක | ඉලක්කය | සත්‍ය | සමුච්ඡිත ප්‍රගතිය | % |
| ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය | කි.මී. | 401 | 359 | 320 | 89 |
| කාණු ප්‍රතිසංස්කරණය | කි.මී. | 70 | 70 | 70 | 100 |
| ව්‍යුහ (Structures) ඉදිකිරීම (බෝක්කු, ආරක්ෂිත බැමි, පාලම්, ඇළ මාර්ග ආදිය ඇතුළත්ව) | සංඛ්‍යාව | 426 | 1950 | 2801 | 100 |
| ගොඩනැගිලි ඉදිකිරීම | සංඛ්‍යාව | 5 | 5 | 2 | 40 |
| කුඩා පරිමාණ කෘෂි ළිං 20/නළළිං 60/කි.මී. 44ක වැට ඉදිකිරීම | සංඛ්‍යාව | 930 | 80 | 66 | 82 |
| ධාන්‍ය වියළීමේ භූමි ඉදිකිරීම | සංඛ්‍යාව | 21 | 21 | 21 | 100 |
| වී ගබඩා ඉදිකිරීම | සංඛ්‍යාව | 6 | 3 | 3 | 100 |
| කෘෂි මාර්ග ප්‍රතිසංස්කරණය (කොන්ක්‍රීට් / බොරළු) | කි'මී' | 52/150 | 52/150 | 42 | 80 |

| නිෂ්පාදනය සහ වෙළෙඳපොළ | | | | |
|---|---|---|---|---|
| ක්‍රියාකාරකම | ඒකක | ඉලක්කය | ප්‍රගතිය | % |
| **සමාජ සජීවිකරණය හා පුහුණු වැඩසටහන්** | | | | |
| ගොවි සංවිධාන ශක්තිමත් කිරීම | සංඛ්‍යාව | 21 | 21 | 100 |
| ගොවීන් පුහුණු කිරීම (සියළු ක්ෂේත්‍රයන්හි) | සංඛ්‍යාව | 7000 | 12491 | 94 |
| වැඩි ජලය මුදාහැරීමේ ක්‍රමය පිළිබඳව ගොවීන්ට පුහුණුව ලබාදීම | සංඛ්‍යාව | 1675 | 1072 | 64 |
| **නිෂ්පාදනය හා වෙළෙඳපොළ** | | | | |
| වී නොවන බෝග විවිධාංගීකරණ වැඩසටහන | | | | |
| සැලසුම් කළ පුහුණු වැඩසටහන් | සැසි සංඛ්‍යාව | 461 | 351 | 76 |
| කණ්ඩායම් පිහිටුවීම | කණ්ඩායම් සංඛ්‍යාව | 423 | 423 | 100 |
| වී නොවන බෝග වැඩසටහන යටතේ ගොවීන් පුහුණු කිරීම | පුහුණු සංඛ්‍යාව | 2220 | 3688 | 100 |
| වී නොවන බෝග වැඩසටහන යටතේ වගා කිරීම | අක්කර ප්‍රමාණය | | 1518 | |
| කිරිගව පාලනය පිළිබඳව ගොවීන් පුහුණු කිරීම | පුහුණු සංඛ්‍යාව | 200 | 200 | 100 |
| ඵලදායී කෘෂිකාර්මික භාවිතයන් සඳහා ආදර්ශ වගා බිම් පිහිටුවීම | ආදාර්ශ සංඛ්‍යාව | 500 | 631 | 100 |

| | | | | |
|---|---|---|---|---|
| වී නොවනබෝග වැඩසටහනපිළිබඳ ආදර්ශන | ආදර්ශන සංඛ්‍යාව | 1672 | 2784 | 100 |
| කෘෂි අලෙවි කොන්ත්‍රාත් සඳහා ගොවීන් පුහුණු කිරීම | පුහුණු සංඛ්‍යාව | 350 | 115 | 33 |
| කුඩා ව්‍යාපාර සඳහා ගොවීන් පුහුණු කිරීම | ව්‍යාපාර සංඛ්‍යාව | 350 | 98 | 28 |
| එළවළු හා පලතුරු වගා සඳහා කාන්තා කණ්ඩායම් සහභාගිත්වය ලබාගැනීම | කණ්ඩායම් සංඛ්‍යාව | 423 | 423 | 100 |
| **ක්ෂුද්‍ර මූල්‍ය** | | | | |
| සැලසුම් කළ වැඩසහන් | කණ්ඩායම් සංඛ්‍යාව | 80 | 60 | 75 |
| ක්ෂුද්‍ර මූල්‍ය කණ්ඩායම් පිහිටුවීම (කණ්ඩායම් ඉතුරුම් හා අභ්‍යන්තර ණයදීම්) | කණ්ඩායම් සංඛ්‍යාව | 150 | 150 | 100 |
| ප්‍රතිලාභීන් පුහුණු කිරීම | පුහුණුවූ සංඛ්‍යාව | 750 | 1889 | 100 |
| ක්ෂුද්‍ර මූල්‍ය යටතේ ජීවනෝපාය සඳහා ණය ලබාදිම | ණය සංඛ්‍යාව | 200 | 180 | 90 |
| **ගොවිපළ නොවන ක්‍රියාකාරකම්** | | | | |
| කිරිගව පාලනය පිළිබඳ ගොවීන් පුහුණු කිරීම | පුහුණුවූ සංඛ්‍යාව | 200 | 200 | 100 |
| කිරි නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා කාන්තාවන්ට ආධාර ලබාදීම (කිරි ගවයින් ලබාදීම සඳහා) | ආධාර ලද කාන්තාවන් සංඛ්‍යාව | 200 | 150 | 75 |
| වෙනත් ගොවිපළ නොවන ක්‍රියාකාරකම් සඳහා සුදුසු ආධාර ලබාදිම | ආධාර ලද සංඛ්‍යාව | 300 | ක්‍රියාත්මක වූයේ නැත | |

| මූලාශ්‍රය- ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | |
|---|---|
| <br>පෙර | <br>පසු |
| <br>පෙර | <br>පසු |

# 6.3.3.2.11. නැගී එන ප්‍රදේශවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය

**අරමුණු**

උතුරු, නැගෙනහිර, උතුරු මැද සහ ඌව පළාත්වල, ග්‍රාමීය මාර්ග, මධ්‍යම හා කුඩා ප්‍රමාණ වාරිමාර්ග සහ පානීය ජල සම්පාදන පහසුකම් වැනි මූලික යටිතල පහසුකම් මගින් එම පළාත්වල ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සහ එමගින් ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සඳහා දායකවීම සහ ප්‍රාදේශීය විෂමතා අවම කිරීම.

| | | |
|---|---|---|
| | ණය ආධාර ලබාදෙන ආයතනය | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය(ජයිකා) |
| | ව්‍යාපෘති පිරිවැය | රු.බිලියන 12.8(එක් පළාතකට රු.බිලියන 3.2 ක් බැගින්) |
| | ව්‍යාපෘති කාලය | 2017 අප්‍රේල් - 2021 ජූලි |
| | ක්‍රියාත්මක ප්‍රදේශ | උතුරු, නැගෙනහිර, උතුරු මැද සහ ඌව පළාත් |
| | ව්‍යාපෘති ක්‍රියාකාරකම්<br>උප ව්‍යාපෘති-524<br>➢ ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය -275<br>➢ වාර්මාර්ග පහසුකම් ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණය -151<br>➢ පානීය ජල සම්පාදනය-98 | |

**2016 ක්‍රියාකාරකම්**

- කරුණු සොයා බැලීමේ දූත කණ්ඩායමක් 2016 සැප්තැම්බර් මාසයේදී පැමිණීම හා එහි වාර්තාව සියලු අදාළ පාර්ශ්වයන් විසින් අත්සන් කිරීම
- ණය අනුමත කිරීමේ දූත කණ්ඩායම දෙසැම්බර් මාසයේදී පැමිණීමට නියමිතය.
- 2017 අප්‍රේල් සිට 2017 සැප්තැම්බර් දක්වා ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට නියමිතය.
- සිවිල් වැඩ ආරම්භ කිරීමේ යෝජිත දිනය -2017 ඔක්තෝම්බර්

# 6.3.4. නීති අංශය

**2016 වර්ෂයේ  නීති අංශයේ කාර්ය සාධනය**

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ විෂයපථය තුල ප්‍රධානතම අංශයක් ලෙසට නීති අංශය හඳුන්වා දිය හැක.  පළාත් පාලනයට අදාල නීති වර්ථමානයට උචිත පරිදි කාලීන අවශ්‍යතාමත සකස් කරලීමේහිලා මූලිකත්වය ගෙන කටයුතු කරනු ලබන්නේ අමාත්‍යාංශයේ නීති අංශයයි. මෙම වර්ෂයේ නීති අංශයේ කාර්යය සාධනය පහත පරිදි සංක්ෂිප්ත කොට දැක්විය හැක.

- එහිදී ප්‍රධාන ලෙසින් මහා නගර සභා ආඥාපනත, නගර සභා ආඥාපනත සහ ප්‍රාදේශීය සභා පනත කාලෝචිත පරිදි සංශෝධනය කිරීම සඳහා යෝජනා කැඳවීම, ඒ සඳහා සුදුසු හා අවශ්‍ය සාමාජිකයන්ගෙන් යුතු කමිටු පත් කොට වාර්තා සකස් කිරීම පසුගිය වසරේ දී මෙම අංශය මඟින් සිදු කර ඇත.

- එසේම පළාත් පාලන ආයතන සහ පළාත් සභාවල කාන්තා නියෝජනය බල නැංවීමේ ක්‍රියාදාමයේදී අවශ්‍ය නීති සම්පාදනය කිරීමත් එය සහතික කරලීම උදෙසාත් නීති අංශය දැනට මූලිකව කටයුතු කරනු ලබයි. එහි ආරම්භක පියවර ලෙසින් පළාත් පාලන ආයතන වල කාන්තා නියෝජනය වැඩිකිරීම උදෙසා අදාල නීතිය පාර්ලිමේන්තුවේ සම්මත කර ලීම දක්වා අවශ්‍ය ක්‍රියා මාර්ග ඉටු කිරීමත්,  පළාත් සභා තුල කාන්තා නියෝජනය සහතික කිරීම උදෙසා පාර්ලිමේන්තු පනතක් සම්මත කිරීමට අවශ්‍ය පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමත් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය සමඟ ඒකාබද්ධව දේශපාලනය තුල කාන්තාව බල ගැන්වීම යන මැයෙන් වැඩ මුලු සංවිධානය කිරීමත් එහි මූලාරම්භක වැඩමුලුව වයඹ පළාතෙන් ආරම්භ කිරීමත් 2016 වර්ෂයේදී මෙම අංශයේ දායකත්වය ලබා දෙන ප්‍රධාන කාර්යයන් ලෙස දැක්විය හැක.

**දේශපාලනය තුල කාන්තාව බල ගැන්වීම පිළිබඳ දැනුවත් කිරීමේ අවස්ථාවක්**






- මහජන සෞඛ්‍යට හා පරිසරයට අදාල නීති සකස් කිරීමට අදාලව විශේෂ කාර්යයක් වූයේ අයාලේ යන සුනඛයන්ගෙන් පොදු ජනතාව වෙත සිදුවන අවහිර බාධක හා පීඩා මැඩ පැවැත්වීම පිණිස නීති සකස් කිරීමේ ක්‍රියාවලියේදී ප්‍රමුඛත්වය ගෙන කටයුතු කිරීමයි. ඒ සඳහා මූලික ව ක්‍රමවේදයක් සකස් කිරීමත් එකී ක්‍රමවේදය නියාමනය කිරීම පිණිස කමිටුවක් පත් කිරීමත් නීති අංශය මඟින් මෙම වර්ෂයේ දී සිදු කරන ලදී.

- තවද ගුණාත්මක ප්‍රාදේශීය පාලනයක් ඇති කිරීම උදෙසා අවශ්‍ය මගපෙන්වීම මෙම අමාත්‍යංශයේ ප්‍රධාන කාර්යයකි. මේ යටතේ 2016 වර්ෂයේ දී  පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා ආචාර ධර්ම පද්ධතියක් සකස් කිරීම නීති අංශය විසින් සිදුකරන ලදී. මේ වන විට එම කෙටුම්පත් ආචාර ධර්ම පද්ධතිය දෙමළ හා ඉංග්‍රිසි භාෂා වෙත පරිවර්තන කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර එය අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමු කිරීමේ අනතුරුව  අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීමට ඒ ඒ පළාත් සභාව වෙත යොමු කිරීමට නියමිතය.

**පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා ආචාර ධර්ම පද්ධතියක් සකස් කිරීමේ වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව පැවැත් වීම**



- එසේම වතු කම්කරුවන්ගේ සුභ සාධනය සැලැස්වීම පිණිස ප්‍රාදේශීය සභා පනතේ විශේෂ සංශෝධනයක් කිරීමට ද අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම නීති අංශයෙන් මේ වන විට සිදු කරනු ලැබේ. ඊට අදාලව සිදු කරන ලද සංශෝධන සහිත කෙටුම්පත නීතිපතිගේ සහතිකය ලබා ගැනීම සඳහා නීතිපති දෙපරේතමේන්තුව වෙත මේ වන විට යොමු කර ඇත.

- පළාත් පාලන ආයතන වෙත ලැබිය යුතු උසාවි දඩ මුදල් සහ ඉඩම් පැවරීම මත අයවන මුද්දර ගාස්තු විධිමත්ව සහ කඩිනමින් ඒ එක් එක් පළාත් පාලන ආයතන වෙත හිමි නොවීම කාලයක සිට පළාත් පාලන ආයතන මුහුන දී ඇති විශාල ගැටලුවකි. ඒ අනුව එම උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු කඩිනමින් පළාත් පාලන ආයතන වෙත ලැබීමට සැලැස්වීමට කටයුතු සම්පාදනය කිරීම පිණිස අවශ්‍ය නීති සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීම ද 2016 වර්ෂයේ දී මෙම අංශයෙන් සිදු කරන ලද විශේෂ කාර්යයක් ලෙසින් දැක්විය හැක.

- පළාත් පාලන ආයතන සංස්ථාපනය සඳහා සුදුසු නිර්ණායක හදුනාගැනීමත් ඉදිරියේදී පළාත් පාලන ආයතන සංස්ථාපනය කිරීම, උසස් කිරීම සම්බන්ධව වඩාත් පාරදෘෂ්‍ය හා විධිමත් ක්‍රමවේදයක් හදුන්වා දීමට අවශ්‍ය පියවර හා විධිවිධාන යෙදීමත් සම්බන්ධයෙන් සක්‍රීය දායකත්වයක් ලබා දීමත් මෙම 2016 වසරේ දී නීති අංශයෙන් සිදු කල තවත් ප්‍රධාන කාර්යයක් විය.
- නව පළාත් පාලන ආයතන සංස්ථාපනය සම්බන්ධව පිළිගත් ක්‍රමවේදයක් හෝ ප්‍රත්පත්තියක් නොමැති වීම නිසා නගර සභා මහා නගර සභා ඇති කිරීම විධිමත්ව සිදු නොවන බව මෙම අමාත්‍යාංශය විසින් නිරීක්ෂණය කර ඇත.එබැවින් නව පළාත් පාලන ආයතන සංස්ථාපනය සහ පවත්නා පළාත් පාලන ආයතන උසස් කිරීම සඳහා ජාතික නිර්ණායක තීරණය කිරීම පිණිස ගරු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් 2016. 05.25 දින විද්වත් කමිටුවක් පත් කරන ලදී.
- කමිටුවේ විෂය පථය

1) පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ ජනගහනය, ජනගහන ඝණත්වය, ආර්ථික සංවර්ධන මට්ටම,ආදායම් උත්පාදනය, භූ විෂමතා පවත්නා පරිපාලන සීමා පවත්නා කොට්ඨාස සීමා යන අනෙකුත් අදාල තොරතුරු සැළකිල්ලට ගෙන නිර්ණායක පද්ධතියක් සකස් කිරීම.
2) නව පළාත් පාලන ආයතන බිහිකිරීම සහ පවත්නා පළාත් පාලන ආයතන උසස් කිරීම සම්බන්ධව මහජනතාව, මහජන නියෝජිතයින් සහ අනෙකුත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන ඇතුලු සිවිල් සංවිධාන වල අදහස් ලබා ගැනීම.

එම කමිටුව වරින් වර රැස්වී අදාල නිර්ණායක පිළිබඳ සාකච්ජා කර සලකා බැලිය යුතු කරුණු පිළිබඳව මහජන අදහස් විමසීම සඳහා පළ කරන ලද පුවත්පත් දැන්වීමට අනුව ලද අදහස් ද 1999 පළාත් පාලනය පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ අන්තර්ගත කරුණු ද පිළිබඳව දීර්ඝ වශයෙන් කමිටුවේ අවධානය යොමු කර එහිදී පහත සඳහන් මූලික නිර්ණායක පදනම් කර ගැනීමට තීරණය කරනු ලැබ ඇත.

1. ජනගහණය හා ජනගහන ඝනත්වය (ව.කි. 1ට හෝ ඊට අඩු භූමි ප්‍රදේශයකට)
2. නිවාස ප්‍රමාණය හා ඝණත්වය
3. සේවා හා යටිතල පහසුකම් වල දියුණුව (ජලය, මාර්ග, විදුලිය, දුරකථන, පාසල්, රෝහල් වෙනත් රාජ්‍ය සේවාවන්)
4. පවතින වාණිජ ගොඩනැගිලි සංඛ්‍යාව
5. කෘෂිකාර්මික නොවන ආර්ථික කටයුතුවල යෙදී සිටින ජනගහන ප්‍රතිශතය
6. ප්‍රදේශය ආර්ථික ව්‍යුහය හා සම්පත් විභජනය
7. ප්‍රදේශීය වැදගත්කම (ඓතිහාසික / ආර්ථික හෝ වෙනත්)
8. ප්‍රදේශයේ ආදායම් විභජනය

එකී නිර්ණායක මැන බැලීම සඳහා ලකුණු ක්‍රමයක් සහ බර තැබීමේ ක්‍රමවේදයක් ද පිළියෙල කළ අතර මේ සඳහා අවශ්‍ය තොරතුරු ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ නිල සංඛ්‍යා ලේඛන මත පදනම් කර ගනු ලැබේ.2016/12/31දින වන විට මෙම නිර්ණායක පද්ධතිය සකස් කර අවසන් කර ඇති අතර එකී නිර්නායක මත ඉදිරියේදී පළාත් පාලන ආයතන සංස්ථාපනය සිදු කිරීමට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ප්‍රතිපත්තිමය වශයෙන් තීරණය කර ඇත.

# 6.3.5. පාලන අංශය

**අරමුණ**

අමාත්‍යාංශයේ මානව සම්පත කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගනිමින් අමාත්‍යාංශයේ ඉලක්ක සපුරා ගැනීම සඳහා මානව සම්පත් කළමනාකරණය හා කාර්යාල පහසුකම් සැපයීම.

**ප්‍රධාන කාර්යයන්**

1. මානව සම්පත සැපයීම හා පවත්වාගෙන යාම
2. කාර්යාල ඉඩ පහසුකම් සැලයීම
3. ප්‍රවාහන පහසුකම් සැපයීම
4. ජල, විදුලි, දුරකථන, අන්තර්ජාල පහසුකම් සැපයීම
5. ලිපි බෙදා හැරීමේ කටයුතු
6. නඩත්තු කටයුතු
7. විශේෂ සැමරුම් හා උත්සව කටයුතු සංවිධානය කිරීම
8. අමාත්‍යාංශයේ ඉහළම ස්ථරයේ සිට පහළම ස්ථරය දක්වා වූ සියලුම කාර්ය මණ්ඩලයේ මානව සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩටහන් සැලසුම් කිරීම හා පැවැත්වීම

**2016 ප්‍රගතිය**

| වගු අංක 21 - මූල්‍ය ප්‍රගතිය (2016-12-31 දිනට) | | | |
|---|---|---|---|
| වැඩසටහන | 2016 ඇස්තමේන්තුව රු.මි. | 2016.12.31 දිනට වියදම | ප්‍රගතිය |
| ඵලදායිතාව ඇතුළු දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් | 1.5 | 1.42 | 94.67% |
| නඩත්තු කටයුතු(වාහන) | 36.2 | 32.05 | 88.54% |
| නඩත්තු කටයුතු(යන්ත්‍රෝපකරණ) | 2.9 | 2.9 | 100% |
| නඩත්තු කටයුතු(ගොඩනැගිලි) | 13.1 | 12 | 91.6% |
| **එකතුව** | **53.7** | **38.23** | |

මූලාශ්‍රය-පාලන අංශය

| ප්‍රගතිය (2016-12-31 දිනට) - පාලන අංශය | | |
|---|---|---|
| **වැඩසටහන** | **වැඩසටහන් සංඛ්‍යාව** | **විශේෂ කරුණු** |
| ඵලදායිතාව ඇතුළු දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සැලසුම්කිරීම හා පැවැත්වීම | 23 | 276 |
| මානව සම්පත් දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම | 1 | සියලුම අංශවලින් තොරතුරු රැස් කිරීම, සැකසීම සිදුකර ඇත. දත්ත පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා මේ වසරේ ප්‍රතිපාදන නොමැති නිසා ලබන වසරේ ප්‍රතිපාදනවලින් එය සිදුකිරීමට සැලසුම් කර ඇත. |
| නඩත්තු ඒකකයක් පිහිටුවීම | 1 | විදුලි කාර්මික ශිල්පි තනතුර සඳහා බඳවා ගෙන ඇති අතර තාක්ෂණ ශිල්පි තනතුර සඳහා බඳවාගැනීමේ පටිපාටි සකස් කොට අනුමතියට ඉදිරිපත් කර ඇත. |

මූලාශ්‍රය-පාලන අංශය

# 6.3.6. වියදම් විමංසන අංශය

පළාත් සභා වෙත මධ්‍යම රජය විසින් වාර්ෂිකව දෙනු ලබන ප්‍රදානයන් එම ආයතන විසින් උපයෝගී කරගනු ලබන ආකාරය පිළිබඳ අඛණ්ඩ ඇගයීමක් කිරීම විමංසන අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. මෙම කාර්යය සඳහා මධ්‍යම රජය විසින් දෙනු ලබන ප්‍රදානය, පළාත් සභා ඇස්තමේන්තු, සත්‍ය ආදායම් හා වියදම් සම්බන්ධ තොරතුරු උපයෝගී කරගනු ලබයි. මෙම තොරතුරු විමංසනය තුළින් මතුවන විචල්‍යතා හා ගැටළු පළාත් මූල්‍ය කළමනාකරණයේ අවධානයට ලක්කිරීමට කටයුතු කරන අතර එමගින් තම මූල්‍ය කටයුතුවල අපේක්ෂිත ඉලක්කයන් කරා පළාත් සභා යොමු කරවීම අරමුණු කෙරේ.

**2016 වර්ෂයේ ක්‍රියාකාරකම් (2016.12.31 දිනට ප්‍රගතිය)**

01. 2016 වර්ෂය තුළ මධ්‍යම රජය විසින් දෙනු ලබන ප්‍රදානයන් හා පළාත් සභා ආදායම් ඇස්තමේන්තුගත වියදම් සීමාවන්ට යටත්ව එම ආයතන විසින් වියදම් කරනු ලබන ආකාරය පිළිබඳව අඛණ්ඩ ඇගයීමක් කරන ලද අතර 2016.12.31 දිනට පළාත් සභාවල 2016 නොවැම්බර් මාසය දක්වා වන මූල්‍ය කාර්ය සාධන මාසික වාර්තා හා 2016 පළමු, දෙවන හා තෙවන කාර්තුවලට අදාල කාර්තු වාර්තා සකස් කර අවසන් කර ඇත.

02. 2016 පළමු, දෙවන හා තෙවන කාර්තු වාර්තා සියලුම පළාත් සභාවන් හා මහා භාණ්ඩාගාරය වෙතත් ජන සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඔවුන්ගේ කාලීන වාර්තා වල පළ කිරීම සඳහාත් එසේම මෙම තොරතුරු අපේක්ෂිත අනෙකුත් ආයතන වෙතත් අවශ්‍ය කටයුතු සඳහා නිකුත් කර ඇත.

03. පළාත් සභා හා පළාත් පාලන ආයතනවල සේවක සංඛ්‍යා සම්බන්ධයෙන් පවත්වා ගෙන යනු ලබන දත්ත පදනම 2016.12.31 දිනට යාවත්කාලීන කර ඇත.

04. පළාත් පාලන ආයතනයන්හි ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පදනම 2016 වර්ෂයේ දී 2015 වර්ෂයට අදාලව යාවත්කාලීන කරන ලද අතර, එම තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව පළාත් පාලන ආයතනවල මූල්‍ය කාර්යය සාධනය සම්බන්ධ වාර්තාවක් සකස් කර සියලුම පළාත් පාලන කොමසාරිස්වරුන් වෙත යවා ඇත. පළාත් පාලන ආයතන වන මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වල පොදු පහසුකම් පිළිබඳ තොරතුරු රැස්කර එම තොරතුරු අදාළ වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.

05. මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන පළාත් පාලන ආයතන අධිභාර අභියාචනා සලකා බැලීම සම්බන්ධයෙන් වන කටයුතු ඉටු කිරීම මෙම අංශය මගින් කරනු ලබන තවත් කාර්යයකි. 2016.12.31 දක්වා ඉදිරිපත් කර ඇති අධිභාර අභියාචනා සලකා බැලීම සම්බන්ධයෙන් වන කටයුතු කරන ලදී.

06.මෙම අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘතීන්හි මූල්‍ය කාර්ය සාධනය හා සම්බන්ධ තොරතුරු මාසිකව ලබා ගෙන එම තොරතුරු පළාත් සභා මූල්‍ය කාර්ය සාධන වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.

07. පළාත් සභාවන්හි මූල්‍ය කටයුතු විමංසනය කිරීමේ අරමුණින් විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම, බැංකු සැසඳුම් පිළියෙල කිරීම, අත්තිකාරම් ගිණුම් සැසඳීම, අග්‍රිම ගිණුම් සැසඳීම යනා දී කටයුතු සම්බන්ධයෙන් විශේෂයෙන් සකසා යවනු ලැබූ ආකෘති පත්‍ර මඟින් 2016 වර්ෂයේ දී කාර්තුමය වශයෙන්(පළමු , දෙවන හා තෙවන කාර්තු සඳහා) තොරතුරු පළාත් සභා වෙතින් ගෙන්වා ගන්නා ලදී. එම තොරතුරු උපයෝගී කර ගනිමින් අදාළ කාර්යයන්හී ප්‍රගතිය විමසා බලන ලද අතර, එම කටයුතු සම්බන්ධයෙන් පවත්නා ප්‍රමාදයන් සහ ගැටළු සහගත තත්ත්වයන් පළාත් මූල්‍ය කළමනාකරණයේ අවධානයට යොමු කර ඇත.

08. මාසිකව පළාත් සභා වෙතින් ලබා ගන්නා තොරතුරු මත පිළියෙල කර ඇති 2014, 2015 වර්ෂයන්ට හා 2016 නොවැම්බර් මාසය දක්වා අදාල මුදා හැරීම්, ආදායම් හා වියදම් සම්බන්ධ වාර්තා හා පළාත් පාලන ආයතන වෙතින් වාර්ෂිකව ලබා ගන්නා අදායම් හා වියදම් සම්බන්ධ තොරතුරු මත පිළියෙල කර ඇති වාර්තා මේ සමඟ අමුණා ඉදිරිපත් කරමි.

## පළාත් සභා සඳහා මූල්‍ය ප්‍රදාන

රජය විසින් මෙම අමාත්‍යාංශය හරහා පළාත් සභා සඳහා වාර්ෂිකව තුන්වැදෑරුම් ප්‍රදානයන් වන සාමූහික ප්‍රදාන, උපමාන පාදක ප්‍රදාන සහ පළාත් කාර්යය නිශ්චිත සංවර්ධන ප්‍රදාන මෙම ප්‍රදානයන් සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන පළාත් සභාවල සහ අමාත්‍යාංශයේ වාර්ෂික ඇස්තමේන්තුවලට ඇතුළත් කෙරේ.මෙලෙස ලබා දෙන ප්‍රදාන පළාත් සභා විසින් ස්වකීය වාර්ෂික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා උපයෝගී කරගනු ලැබේ.

වගු අංක 22 - මධ්‍යම රජයේ ප්‍රදාන හා එම ප්‍රදාන මුදාහැරීම්

| පුනරාවර්තන ප්‍රදාන | 2014 | | | 2015 | | | 2016 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්ත මේන්තුව | සත්‍ය | % | ඇස්ත මේන්තුව | සත්‍ය | % | ඇස්ත මේන්තුව | 2016.11.30 දිනට මුදාහැරීම් | % |
| සාමූහික ප්‍රදාන | 126,144.0 | 126,144.0 | 100% | 167,556.0 | 167,484.0 | 100% | 166,418.0 | 153,332.0 | 92% |
| a. මුළු පුනරාවර්තන ප්‍රදාන | 126,144.0 | 126,144.0 | 100% | 167,556.0 | 167,484.0 | 100% | 166,418.0 | 153,332.0 | 92% |
| ප්‍රාග්ධන ප්‍රදාන | | | | | | | | | |
| උපමාන පාදක ප්‍රදාන | 3,875.0 | 2,180.0 | 56% | 3,785.0 | 3,752.0 | 99% | 4,000.0 | 541.0 | 71% |
| පළාත් කාර්යය නිශ්චිත සංවර්ධන ප්‍රදාන* | 12,921.0 | 9,255.0 | 72% | 15,629.0 | 13,845.0 | 89% | 28,235.0 | 2,166.0 | 34% |
| b. මුළු ප්‍රාග ්ධන ප්‍රදාන | 16,796.0 | 11,435.0 | 68% | 19,414.0 | 17,597.0 | 91% | 32,235.0 | 2,707.0 | 38% |
| මුළු ප්‍රදාන (a+b) | 142,940.0 | 137,579.0 | 96% | 186,970.0 | 185,081.0 | 99% | 198,653.0 | 85,764.0 | 83% |

මූලාශ්‍රය- වියදම් විමංසන අංශය

### වගු අංක 23 - පළාත් සභා මුළු ආදායම

(රු.මි.)

| ආදායම් වර්ගය | 2014 | | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|---|
| පිරිවැටුම් බදු | 73.5 | 298.0 | 120.0 | 448.0 | 83.0 | 38.0 |
| වාහන බලපත්‍ර ගාස්තු | 6,497.0 | 7,481.0 | 7,475.0 | 8,711.0 | 10,465.0 | 7,631.0 |
| මත්පැන් බලපත්‍ර ගාස්තු | 965.0 | 942.0 | 842.0 | 1,820.0 | 1,148.0 | 1,141.0 |
| පොළී | 1,387.0 | 1,409.0 | 1,055.0 | 1,115.0 | 1,065.0 | 1,516.0 |
| උසාවි දඩ | 2,033.0 | 1,841.0 | 1,846.0 | 1,971.0 | 1,945.0 | 2,080.0 |
| මුද්දර ගාස්තු | 19,477.0 | 21,759.0 | 23,891.0 | 27,000.0 | 27,987.0 | 29,925.0 |
| අනෙකුත් | 41,247.5 | 25,404.0 | 31,803.0 | 26,907.0 | 30,256.0 | 28,309.0 |
| **මුළු ආදායම** | **60,493.0** | **59,134.0** | **67,032.0** | **67,972.0** | **72,949.0** | **70,640.0** |

මූලාශ්‍රය- වියදම් විමංසන අංශය

වගු අංක 24 - පළාත් සභාවන්හි පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම

(රු.මි.)

| වියදමේ ස්වභාවය | 2014 | | | 2015 | | | 2016 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්ත මේන්තුව | සත්‍ය | % | ඇස්ත මේන්තුව | සත්‍ය | % | ඇස්ත මේන්තුව | 2016.11.30 දිනට වියදම | % |
| a. පුනරා-වර්තන වියදම | 179,149.0 | 172,131.0 | 90 | 228,374.0 | 222,223.0 | 97 | 241,156.0 | 214,223.0 | 98 |
| ප්‍රාග්ධන වියදම | | | | | | | | | |
| උපමාන පාදක ප්‍රදාන යටතේ වියදම | 13,004.0 | 10,249.0 | 79 | 9,681.0 | 7,342.0 | 76 | 5,815.0 | 4,422.0 | 96 |
| පළාත් කාර්යය නිශ්චිත සංවර්ධන ප්‍රදාන* | 15,629.0 | 11,662.0 | 75 | 15,629.0 | 12,845.0 | 82 | 27,323.0 | 10,935.0 | 40 |
| b. ප්‍රාග ්ධන වියදම් එකතුව | 28,633.0 | 21,911.0 | 77 | 25,310.0 | 20,187.0 | 80 | 33,138.0 | 15,357.0 | 46 |
| **මුළු එකතුව (a+b)** | **207,782.0** | **194,042.0** | 93 | **253,684.0** | **242,410.0** | 96 | **274,294.0** | **229,580.0** | 84 |

* - පළාත් කාර්ය නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අධ්‍යාපනය හා සෞඛ්‍ය වැඩිදියුණු කිරීමේ ප්‍රදාන ද ඇතුළත් වේ.

මූලාශ්‍රය- වියදම් විමංසන අංශය

# 6.3.7. අභ්‍යන්තර විගණන අංශය

ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීන් වෙත පැවරෙන රාජ්‍ය සම්පත් කාර්යක්ෂමව, ඵලදායීව, අරපිරිමැස්මෙන් භාවිත කර සංවර්ධන ව්‍යාපෘතීන් කලට වේලාවට අවසන් කිරීමේ වගකීම නිසි පරිදි ඉටු කිරීම සඳහා විගණන සහාය ලබාදීම අභ්‍යන්තර විගණනයේ කාර්යභාරය වේ. මෙහිදී මුදල් රෙගුලාසි 133(I) අ (II) සඳහන් පරිදි ''දෙපාර්තමේන්තුවට නියම කෙරුණු හෝ දෙපාර්තමේන්තු විසින් භාර ගන්නා ලද සංවර්ධන ව්‍යාපෘති, සැලසුම් සහ වැඩසටහන් සපුරාලීමෙහිලා ලබා ඇති ප්‍රගතිය නිශ්චය කිරීමට ගණන් දීමේ නිළධාරියාට සහ ප්‍රගති අන්වේශන කමිටුවට සහය වීම''




මේ අනුව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයට පැවරෙන කාර්යභාරය වන්නේ සියලු අංශ, ව්‍යාපෘති හා අනුබද්ධිත ආයතනවල රාජ්‍ය සම්පත් කාර්යක්ෂමව, ඵලදායීව, අරපිරිමැස්මෙන් භාවිත කර සංවර්ධන ව්‍යාපෘතීන් කලට වේලාවට අවසන් කිරීමේ වගකීම නිසි පරිදි ඉටු කිරීම සඳහා විගණන සහාය ලබාදීමය.

**2016 ක්‍රියාකාරකම්**

01. කළමණාකරණ විගණන ඩීඑම්ජී/2009(1) හා 2009.06.09 දිනැති චක්‍රලේඛයෙහි ඇමුණුම 03 පරිදි අමාත්‍යාංශයේ මූලික වාර්තාව සකස් කර 2016.02.08 දින කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට යවා ඇත.

02. කළමණාකරණ විගණන ඩීඑම්ජී/2009(1) හා 2009.06.09 දිනැති චක්‍රලේඛයෙහි 07 පරිච්ඡේදය අනුව ඇමුණුම 02 පරිදි අමාත්‍යාංශයේ විගණන සැළැස්ම සකස් කර 2016.01.26 දින ඉදිරිපත් කළ අතර, අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම නැවත සංශෝධනය කර සකස් කිරීම නිසා නැවත එම සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ විගණන සැළැස්ම සකස් කර 2016.05.31 දින ලේකම්තුමාගේ අනුමැතියට ඉදිරිපත් කර කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.

වගු අංක 25 - ඉදිරිපත් කරන ලද විගණන විමසුම් (2016.12.31 දිනට)

| වගු අංක 25 - ඉදිරිපත් කරන ලද විගණන විමසුම් (2016.12.31 දිනට) | | | |
|---|---|---|---|
| | විගණනය සිදු කළ ආයතනය | විගණනය සිදු කළ කාලය | විගණන විමසුම් |
| 01 | පළාත් මාර්ග ව්‍යාපෘතිය - ඌව කාර්යාලය | 2015.01.01-2015.09.15 | ඉදිරිපත් කළ දිනය |
| 02 | පළාත් මාර්ග ව්‍යාපෘතිය - සම්බන්ධීකරණ ඒකකය | 2015.01.01-2015.10.15 | 2016.02.24 |
| 03 | පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | 2015.07.01-2015.09.30 | 2016.03.29 |
| 04 | පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ( පුර නැගුම ) | (3 වන කාර්තුව) 2015.01.01-2015.12.31 | 2016.05.04 |
| 05 | පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | 2015.10.01-2015.12.31 (4 වන කාර්තුව) | 2016.07.11 |
| 06 | උතුරු නැගෙනහිර පළාත් පාලන ආයතන සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 2015.01.01-2015.12.31 | 2016.08.31 |
| 07 | දේශීය ණය සහ සංවර්ධන අරමුදල - 2014 | 2014.01.01-2014.12.31 | 2016.09.02 |
| 08 | දේශීය ණය සහ සංවර්ධන අරමුදල - 2015 | 2015.01.01-2015.12.31 | 2016.09.26 |
| 09 | පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | 2016.01.01-2016.06.30 | 2016.12.30 |

මූලාශ්‍රය- අභ්‍යන්තර විගණන අංශය

# 6.3.8. ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය

### 6.3.8.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

දැක්ම : සැමට වඩාත් සුවපහසු පරිසරයක්

අරමුණ : පළාත් පාලන බල ප්‍රදේශවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම

**කාර්යභාරයඃ**

- පළාත් පාලන ආයතන සඳහා විධිමත් හා යෝග්‍ය ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම් හඳුන්වා දීම පිණිස නීති සම්පාදනය හා උපදේශනය සැපයීම
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ නිසි තාක්ෂණික සහාය පළාත් පාලන ආයතන වෙත ලබාදීම
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ දේශීය හා විදේශීය අත්දැකීම් නිර්මාණයෙහි ලා පළාත් පාලන ආයතන දිරිගැන්වීම
- රාජ්‍ය නොවන සංවිධාන හා මූල්‍ය ආයතනයන්ගෙන් තාක්ෂණික හා මූල්‍යමය සහාය ලබාගැනීමට පළාත් පාලන ආයතනවලට සහායවීම
- පළාත් පාලන ආයතන තුළ පාරිසරික සංරක්ෂණ මධ්‍යස්ථාන(කොම්පෝස්ට් ව්‍යාපෘති) ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම
- 3R ක්‍රමවේදය වැඩිදියුණු කිරීම
  - ගෘහස්ත කසල කළමනාකරණය සඳහා කොම්පොස්ට් බැරල් බෙදාදීම
  - පාසල්වල කසල කළමනාකරණය සඳහා කසල බඳුන් ලබාදීම
  - පළාත් පාලන ආයතනවල කසල කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා කසල වෙන්කර එකතු කිරීමේ ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
  - පළාත් පාලන ආයතන සහ පාසල් සිසුන් වෙත කසළ වෙන්කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ පෝස්ටර් සහ අත්පත්‍රිකා මුද්‍රණය කර බෙදාදීම
  - විද්‍යුත් මාධ්‍ය භාවිතා කරමින් කසල කළමනාකරණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ
  - දැන්වීම් සකස් කිරීම

**දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සෞඛ්‍ය කම්කරු නිලධාරීන් වෙනුවෙන් හැකියා වර්ධන පුහුණු වැඩමුළු පැවැත්වීම (ජාතික වෘත්තිය පුහුණු සහතිකය ලබා දීම - (National Vocational Qualification - NVQ 4)
- කොම්පොස්ට් සකස් කිරීමේ නව ක්‍රමවේදයක් වන තකකුරා ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- පාසල් සිසුන් සඳහා කසල කළමනාකරණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**විශේෂ ව්‍යාපෘති**

- ජනාධිපති ලේකම් කාර්යාලය මගින් මෙහෙයවනු ලබන පුනරුදය පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන යටතේ මළ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රිකරණ ව්‍යාපෘති කටයුතු ඉටු කිරීම.
- කොළඹ මහ නගර සභාවේ කසල බැහැර කරනු ලබන මීතොටමුල්ල කසල අංගනයේ තවදුරටත් අවශ්‍ය ඉඩකඩ ලබා ගැනීම සඳහා පදිංචි කරුවන් ඉවත් කිරීමේ කටයුතු සඳහා සහාය වීම.
- ගංවතුරින් හානියට පත්වූ කොළොන්නාව, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමා තුළ කසල ඉවත් කිරීමේ කටයුතු සිදු කිරීම.

**ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වාහන හා උපකරණ ලබාදීම**

පළාත් 9 ආවරණය වන පරිදි පළාත් පාලන ආයතන සඳහා බොබ් කැට් යන්ත්‍ර , සංඥා නාද උපකරණ කට්ටල, කම්පැක්ටර් රථ ලබාදීම

අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන උපාය මාර්ග, ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදනය සඳහා වන විශේෂඥ කමිටුවේ උපදේශන සභාවේ හා විශේෂඥ කමිටුවේ උපදෙස් පරිදි පළාත් 09 වෙනුවෙන් කසල කළමනාකරණය සඳහා වන සැලසුම් සකස් කිරීම කරගෙන යනු ලැබේ.

**වගු අංක 26 - ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රගතිය (2016.12.31 දිනට)**
**ජාතික ඝන අපද්‍රව්‍යය කළමනාකරණ ව්‍යාපෘතිය**

| අනු අංකය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත වටිනාකම (රු.) | සත්‍ය වියදම (රු.) | සත්‍ය භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 01 | කොම්පෝස්ට් අංගන හා ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථාන ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම | 17,959,196.09 | 23,975,676.25 | 100% |
| 02 | මල අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථාන ඉදිකිරීම | 16,983,546.17 | 3,131,449.22 | 100% |
| 03 | යන්ත්‍රෝපකරණ මිලදීගැනීම හා බෙදාහැරීම | 36,000,000.00 | 39,042,000.00 | 100% |
| 04 | ජනනය වන ස්ථානයේදීම කසල වෙන් කිරීම හා ගෘහස්ත කාබනික පොහොර නිෂ්පාදනය වැඩිදියුණු කිරීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 22,500,000.00 | 29,538,996.00 | 100% |
| 05 | දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම | 6,000,000.00 | 5,494,959.00 | 100% |
| 06 | අමාත්‍යාංශ පරිශ්‍රය තුළ කසල කළමනාකරණ වැඩසටහන | 500,000.00 | 24,583.96 | 10% |
| 07 | කසල කළමනාකරණය සම්බන්ධ විවිධ ක්‍රියාකාරකම් සහ නව යෝජනා | 3,000,000.00 | 1,957,552.00 | 100% |
| | යොවුන් පුරය 2016 - කසල කළමනාකරණ වැඩසටහන | | | |
| 08 | කොළඹ මහ නගර සභාවේ කසල බැහැර කරනු ලබන මීතොටමුල්ල කසල අංගනයේ තවදුරටත් අවශ්‍ය ඉඩකඩ ලබාගැනීම සඳහා පදිංචිකරුවන් ඉවත්කිරීමේ කටයුතු | 216,000,000.00 | 105,000,000.00 | 100% |
| 09 | ගංවතුරින් හානියට පත්වූ කොළොන්නාව, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බලප්‍රදේශ සීමා තුළ කසල ඉවත් කිරීමේ කටයුතු | 18,310,000.00 | 10,194,830.00 | 100% |
| **එකතුව** | | **337,252,742.26** | **218,360,046.43** | **100%** |



ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ
කොම්පෝස්ට් අංගන ඉදිකිරීම



හම්බන්තොට මහා නගර සභාවේ
ගලි පිරිපහදු පද්ධතිය නවීකරණය



කසළ කළමනාකරණය පිළිබඳ පාසල් ළමුන්
දැනුවත් කිරීම හා කසළ බඳුන් ලබාදීම
බලපිටිය ප්‍රාදේශීය සභාව



තකකුරා කොම්පෝස්ට් ක්‍රමවේදය
පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
බොරැල්ල වෙස්ලි

# 6.3.8.2. ඩෙංගු මර්දන වැඩසටහන

අරමුණ

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට අනුබද්ධ සියළුම ආයතන මූලික කොට ගෙන ඩෙංගු අවදානම් සහිත පරිසරයන් අවම කිරීමට ආයතන දැනුවත් කරමින් අවශ්‍ය වැඩසටහන් සම්පාදනය කර හා ඒවා අඛන්ඩව ක්‍රියාත්මක කිරීමට සහාය දීම මගින් ඩෙංගු වලින් තොර පරිසරයක් ගොඩනැගීම.

**ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්**

- ඩෙංගු අධි අවධානම් කලාපයන් ලෙස කාලීනව නම්කරනු ලබන පළාත් පාලන ආයතන සඳහා ඔවුන් එම අවධානම් තත්වයේ සිටින බවත් අවශ්‍ය පියවර ගැනීම සඳහා ලිඛිතව දැනුම් දීමත් , අවශ්‍ය සහාය ලබාදීමෙන් එම අවධානමෙන් මිදීමට අවශ්‍ය දැනුවත් කිරීම් හා සහාය ලබා දීමට
- දිස්ත්‍රික් මට්ටමේ හා පළාත් මට්ටමේ නිලධාරීන් දැනුවත් කිරිම මගින් නිරන්තර අවධානයක් මේ සඳහා යෙදවීමට ආයතන හා නිලධාරීන් යොමු කරවීම .
- ජනාධිපති විශේෂ ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දි අවශ්‍ය සහාය හා සම්බන්ධීකරණය සිදු කිරීම.
- මදුරුවන් බෝවන ස්ථාන නැති කිරීම සඳහා කසල අවම කිරීමට, කසල බඳුන් බෙදාදීමේ දි මහජනතාව හා පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් වලදි අවශ්‍ය අත්පත්‍රිකා ලබාදීම හා දැනුවත් කිරීම් සිදු කිරීම.
- ඩෙංගු මර්ධන සති සම්බන්ධයෙන් සියලුම පළාත් පාලන ආයතන දැනුවත් කිරීම හා අවශ්‍ය සහාය ලබාදෙන ලෙස දැන්වීම.
- ඩෙංගු රෝගය බෝවීම පාලනය කිරීමේ දි වඩා වැදගත් වන කාරණා සම්බන්ධයෙන් චක්‍රලේඛන හා උපදෙස් සැපයීම හා අවශ්‍යතාවය මත අතුරු ව්‍යවස්ථාවන් පනවා ගැනීමේ වැදගත් කම පෙන්වාදීම.
- ඩෙංගු අධි අවධානම් කලාප ලෙස හඳුනාගත් පාළාත් පාලන ආයතන 35 ක් සඳහා ධූමායන යන්ත්‍ර ලබා දීම.
- ඩෙංගු සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි නිරීක්ෂණය කර ඒවා සඳහා පිළියම් ලබාදීම.

# 6.3.9. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය 1999 අංක 31 දරණ පාර්ලිමේන්තු පනත මඟින් ස්ථාපිත කර ඇති මෙම ආයතනයේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය කිරීම සඳහා පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු නිල බලයෙන් සාමාජිකයන් 8 දෙනෙක් සහ අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා විසින් පත්කරනු ලබන සාමාජිකයන් 5 දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් පත් කර ඇත. මෙහි පරිපාලන කටයුතු සිදුකරනු ලැබෙන්නේ ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂකවරයා විසිනි.

**පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ කාර්යභාරය**

- පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකයන්හි සහභාගීත්වය ඇතිව පළාත් සභා හා පළාත් පාලන ආයතනයන්හි ආයතනික ශක්තිය වැඩි දියුණු කරලීම සඳහා පුහුණු කිරීම්, උපදේශන සේවා හා පර්යේෂණ දියත්කිරීම.
- පළාත් සභා හා පළාත් පාලන ආයතනයන්හි කාර්යක්ෂමතාව වැඩි දියුණු කරලීම පිණිස පළාත් කළමනාකරණ සහ පුහුණු ඒකක ශක්තිමත් කිරීම.
- පළාත් පාලනයේ සියලු පාර්ශවකරුවන්ට  තාක්ෂණ හා තොරතුරු සේවා සපයමින් ජාතික සම්පත් මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.
- අදාල ජාතික හා අන්තර්ජාතික ආයතන සමඟ සබඳතා පවත්වා ගනිමින් පළාත් පාලනයේ කේන්ද්‍රීය ස්ථානයක් ලෙස කටයුතු කිරීම.
- මානව සම්පත් සංවර්ධනය, කළමනාකරණය සහ ආයතනික කටයුතු වැඩිදියුණු කිරීම සම්බන්ධව විශේෂඥ සේවා සැපයීම.
- පළාත් සභා හා පළාත් පාලන ආයතනවලට අදාල දත්ත හා තොරතුරු එක්රැස් කිරීම සහ එම තොරතුරු පවත්වාගෙන යාම.
- ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළාත් පාලනයට සම්බන්ධිත ආයතන සමග අන්තර් සබඳතා ගොඩනගා ගනිමින්පළාත් පාලනයපෝෂණයකිරීම.

වැඩසටහන්.

ජාතික / ප්‍රාදේශීය මට්ටමේ පුහුණුවැඩමුළු
අන්තර් ජාතික / ජාතික මට්ටමේ සම්මන්ත්‍රණ
ප්‍රායෝගික සැසි උදා:- අතුරු ව්‍යවස්ථා / ප්‍රඥප්ති සකස් කිරීම
පළාත් පාලන ආයතනවල අවසන් ගිණුම් සැකසීම

**ඩිප්ලෝමා පාඨමාලා**

- පළාත් පාලනය හා ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව
- පළාත් පාලන ඩිප්ලෝමා පාඨමාලාව
- මූල්‍ය කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව
- පළාත් පාලන ඉංජිනේරු ඩිප්ලෝමාව
- ප්‍රජා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

**සහතික පත්‍ර පාඨමාලා**

- ව්‍යාපෘති කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාව
- පුස්තකාල කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාව
- මානව සම්පත් කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාව
- AutoCAD මෘදුකාංග පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
- පළාත් පාලනනීතිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- ප්‍රජා සංවර්ධනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව

- විමර්ශන නිලධාරීන් සඳහා වන සහතික පත්‍ර පාඨමාලාව
- පරිගණක සහතික පත්‍ර පාඨමාලාව
- පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- භාෂා පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලා
- පරිසර කළමනාකරණය හා ආපදා කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
- ත්‍රිමාණකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව

**පර්යේෂණ**

**උපදේශණ සේවා සැපයීම**

**අත්පොත්, අත්පත්‍රිකා ප්‍රකාශයට පත්කිරීම**

**පළාත්පාලන**"පුවත්පත (සිංහල/දෙමළ) හ පළාත්පාලනය පිළිබඳ වාර්ෂික සඟරාව ප්‍රකාශයට පත්කිරීම

වගු අංක 27 - ඉංජිනේරු අංශය- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
(2016 සිව්වන කාර්තුව දක්වා ප්‍රගතිය)

| අංකය | වැඩමුළුවේ නම | 2016 ඉලක්කය (වැඩමුළු සංඛ්‍යාව) | ප්‍රගතිය (වැඩමුළු සංඛ්‍යාව) | ඉලක්කගත පුහුණුලාභීන් සංඛ්‍යාව | සහභාගී වූ පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | පළාත් පාලන ආයතනවල තාක්ෂණික නිළධාරීන් සඳහා දැනුම වැඩි දියුණු කිරීමේ වැඩසටහන(දින02 ) | 04 | 05 | 180 | 173 |
| 02 | පළාත් පාලන ආයතනවල වැඩ පරිපාලකවරුන් සඳහා වු පුහුණු වැඩසටහන (දින 02) | 03 | 02 | 150 | 92 |
| 03 | පළාත් පාලන ආයතනවල සේවයේ නියුතු තාක්ෂණික නොවන කාර්ය මණ්ඩල වෙනුවෙන් දැනුම වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කුසලතා වර්ධනය පිළිබඳ වැඩසටහන ( දින 02) | 04 | 03 | 160 | 156 |
| 04 | පළාත් පාලන ආයතනවල නව පත්වීම් ලැබූ තාක්ෂණික නිළධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන(දින 02) | 02 | 04 | 80 | 90 |
| 05 | කසල කළමනාකරණ පුහුණු වැඩසටහන ( දින 02) | 03 | 03 | 120 | 137 |
| 06 | බර වාහන යන්ත්‍රෝපකරණ නඩත්තුව පිළිබද පුහුණු වැඩසටහන ( දින 02 ) | 05 | 06 | 200 | 248 |
| 07 | පළාත් පාලන ඉංජිනේරු ශිල්පය පිළිබද ඩිප්ලෝමා පාඨමලාව ( අවුරුදු 01 ) | 01 | 01 | 48 | 40 |
| 08 | විශේෂ පුහුණු වැඩසටහන්(දින 01) | 02 | 02 | 80 | 84 |

මූලාශ්‍රය- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

වගු අංක 28 - පොදු කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (2016 සිව්වන කාර්තුව දක්වා ප්‍රගතිය)

| අංකය | වැඩමුළුවේ නම | 2016 ඉලක්කය (වැඩමුළු සංඛ්‍යාව) | ප්‍රගතිය (වැඩමුළු සංඛ්‍යාව) | ඉලක්කගත පුහුණුලාභීන් සංඛ්‍යාව | සහභාගී වූ පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | ප.පා. ආයතන සඳහා වන ආකල්ප හා නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටන් ( දින 01) | 06 | 05 | 240 | 260 |
| 02 | මහජන සම්බන්ධතා හා කණ්ඩායම් ගොඩනැගීමේ වැඩමුළුව( දින 02) | 02 | 02 | 80 | 55 |
| 03 | ප.පා. ආයතන සඳහා තොග පාලනය හා ගබඩා කළමනාකරණය( දින 02) | 02 | 02 | 90 | 100 |
| 04 | සුළු සේවක මණ්ඩලය හා අනෙකුත් අදාල සේවක මණ්ඩලය සඳහා වන පුහුණු වැඩමුළුව( දින 01) | 05 | 05 | 250 | 240 |
| 05 | මානව සම්පත් කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාව (මාස 03) | 01 | 01 | 50 | 44 |
| 06 | නායකත්ව හා අභිප්‍රේරණ වැඩසටහන( දින 02) | 02 | 02 | 90 | 80 |
| 07 | ප.පා. ආයතන සඳහා මානව සම්පත් කළමනාකරණ වැඩමුළුව( දින 02) | 03 | 01 | 120 | 113 |

මූලාශ්‍රය- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

වගු අංක 29 - භෞතික සැලසුම් අංශය-පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (2016 සිව්වන කාර්තුව දක්වා ප්‍රගතිය)

| අංකය | වැඩමුළුවේ නම | 2016 ඉලක්කය (වැඩමුළු සංඛ්‍යාව) | ප්‍රගතිය (වැඩමුළු සංඛ්‍යාව) | ඉලක්කගත පුහුණුලාභීන් සංඛ්‍යාව | සහභාගී වූ පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | ප.පා. ආයතන සඳහා භෞතික සැලසුම් කරණය පිළිබඳ පුහුණු වැඩමුළුව - සිංහල මාධ්‍යය ( දින 02) | 02 | 03 | 100 | 163 |
| 02 | ප.පා. සඳහා භෞතික සැලසුම් කරණය පිළිබඳ පුහුණු වැඩමුළුව - දෙමළ මාධ්‍යය ( දින 02) | 01 | 01 | 50 | 60 |
| 03 | ජීපීඑස් තාක්ෂණය පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන (දින 02) | 01 | 01 | 50 | 50 |
| 04 | පරිසර කළමනාකරණය හා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩමුළුව( දින 01) | 04 | 04 | 160 | 186 |
| 05 | නගර සැලසුම් කිරීම, නගර ප්‍රතිනිර්මාණය සහ කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන (දින 01) | 04 | 02 | 160 | 105 |
| 06 | දේපල තක්සේරුකරණය හා වරිපනම් පිළිබඳව සාමාන්‍ය දැනීම ලබාදීම පිළිබඳ පුහුණු වැඩසටහන( දින 02) | 01 | 03 | 120 | 178 |
| 07 | AutoCAD තාක්ෂණය පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන ( දින 02 ) | 01 | 01 | 20 | 16 |

මූලාශ්‍රය- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

වගු අංක 30 -පර්යේෂණ අංශය-පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
(2016 සිව්වන කාර්තුව දක්වා ප්‍රගතිය)

| අංකය | වැඩමුළුවේ නම | 2016 ඉලක්කය (වැඩමුළු සංඛ්‍යාව) | ප්‍රගතිය (වැඩමුළු සංඛ්‍යාව) | ඉලක්කගත පුහුණුලාභීන් සංඛ්‍යාව | සහභාගී වූ පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | පළාත් පාලන ක්ෂේත්‍රයට අදාළ මාතෘකාවක් පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයක් | 01 | 01 | - | - |
| 02 | අදායම් ප්‍රවර්ධනය පිළිබද පළාත් පාලනය ආයතන මට්ටමේ වැඩසටහන්( දින 02) | 03 | 03 | 150 | 161 |
| 03 | අඩු ආදායම් පළාත් පාලන ආයතනවල ආදායම් අධීක්ෂණ ක්‍රියාවලිය ( දින 01) | 18 | 06 | 1000 | 302 |
| 04 | ප.ස./ප.පා.ආයතනවල නිළධාරීන් සදහා පර්යේෂණ ක්‍රමවේදය පිළිබද පුහුණු වැඩමුළු ( දින 02) | 06 | 02 | 200 | 119 |
| 05 | ප.ස./ප.පා.ආයතනවල නිළධාරීන් සදහා පර්යේෂණ ක්‍රමවේදය පිළිබද සහතික පත්‍ර පාඨමාලාව ( මාස 03 ) | 01 | 01 | 40 | 37 |

මූලාශ්‍රය- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

වගු අංක 31 - මූල්‍ය කළමනාකරණ අංශය-පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
(2016 සිව්වන කාර්තුව දක්වා ප්‍රගතිය)

| අංකය | වැඩමුළුවේ නම | 2016 ඉලක්කය (වැඩමුළු සංඛ්‍යාව) | ප්‍රගතිය (වැඩමුළු සංඛ්‍යාව) | ඉලක්කගත පුහුණුලාභීන් සංඛ්‍යාව | සහභාගී වූ පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිත අනුව පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ප්‍රායෝගික පුහුණු වැඩමුළුව ( දින 04) | 05 | 04 | 250 | 200 |
| 02 | පළාත් පාලන ආයතනවල ආදායම් කළමනාකරණය පිළිබද පුහුණු වැඩමුළුව(දින 02) | 05 | 02 | 250 | 108 |
| 03 | පළාත් පාලන ආයතනවල අයවැය සම්පාදනය පිළිබද පුහුණු වැඩමුළුව ( දින 02) | 05 | 03 | 250 | 154 |
| 04 | විගණනය පිළිබද පුහුණු වැඩමුළුව( දින 02) | 06 | 03 | 300 | 166 |

මූලාශ්‍රය- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

වගු අංක 32 - නීති හා ව්‍යවස්ථාදායක කටයුතු අංශය-පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
(2016 සිව්වන කාර්තුව දක්වා ප්‍රගතිය)

| අංකය | වැඩමුළුවේ නම | 2016 ඉලක්කය (වැඩමුළු සංඛ්‍යාව) | ප්‍රගතිය (වැඩමුළු සංඛ්‍යාව) | ඉලක්කගත පුහුණුලාභීන් සංඛ්‍යාව | සහභාගී වූ පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | පළාත් පාලනයට අදාල අතුරු ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ පුහුණු වැඩමුළුව (දින 02) | 05 | 02 | 235 | 241 |
| 02 | පළාත් පාලන ආයතනවල සභා රැස්වීම් පිළිබඳ පුහුණු වැඩමුළුව ( දින 02) | 06 | 05 | 97 | 100 |

මූලාශ්‍රය- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

වගු අංක 33 - ආයතනික ධාරිතා සංවර්ධන අංශය-පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
(2016 සිව්වන කාර්තුව දක්වා ප්‍රගතිය)

| අංකය | වැඩමුළුවේ නම | 2016 ඉලක්කය (වැඩමුළු සංඛ්‍යාව) | ප්‍රගතිය (වැඩමුළු සංඛ්‍යාව) | ඉලක්කගත පුහුණුලාභීන් සංඛ්‍යාව | සහභාගී වූ පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | ආයතනික අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ පුහුණු කිරීම දේශීය / විදේශීය | 15 | 11 | 40 | 38 |
| 02 | අන්තර් ජාතික ආයතන සමග සම්බන්ධවෙමින් පළාත් පාලනය පිළිබඳව දැනුම හා අත්දැකීම් හුවමාරුව | වැඩසටහන් 03ක් | | | |
| 03 | ආයතනයේ වාර්ෂික වාර්තා සැකසීම | මූල්‍ය වාර්ථා, පාලන වාර්ථාව හා ප්‍රගති වාර්ථා සකස් කර තිබේ | | | |
| 04 | ජාතික මට්ටමේ ප්‍රදර්ශන, ජාතික හා අන්තර් ජාතික මට්ටමේ වැඩසටහන් හා වැඩමුළු සංවිධානය | වැඩමුළු 02 ක් පවත්වා ඇත. | | | |
| 05 | පරිගණක පාඨමාලා හා පුහුණු වැඩසටහන් පැවැත්වීම | 20 | 16 | 500 | 430 |
| 06 | පළාත් පාලනයට අදාල ජාතික / අන්තර් ජාතික මට්ටමේ ව්‍යාපෘති වලට සම්බන්ධවීම | 03 | 02 | | |
| 07 | ආයතනයේ පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම. | ලැප්ටොප්, ඩොන්ගල්, පරිඝණක යන්ත්‍ර හා මල්ටිමීඩියා ආයතනයය වෙත මිලදී ගැනීම | | | |
| 08 | අමාත්‍යාංශයෙන් පැවරෙන විශේෂ වැඩසටහන් | 05 | 03 | පළාත් සභා හා පළාත් පාලන ආයතන නිලධාරීන් | |

මූලාශ්‍රය- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

වගු අංක 34 - පුහුණු අංශය - පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
(2016 සිව්වන කාර්තුව දක්වා ප්‍රගතිය)

| අංකය | වැඩමුළුවේ නම | 2016 ඉලක්කය (වැඩමුළු සංඛ්‍යාව) | ප්‍රගතිය (වැඩමුළු සංඛ්‍යාව) | ඉලක්කගත පුහුණුලාභීන් සංඛ්‍යාව | සහභාගී වූ පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | පළාත් පාලන කළමණාකරණය සංවර්ධන හා පුහුණු ආයතන සම්බන්ධීකරණ රැස්වීම | 04 | 02 | 100 | 111 |
| 02 | ( දින 01) | වර්ෂයකට කලාප 04 | කලාප 03 | | |
| 03 | පළාත් පාලනය පුවත්පත - සිංහල / දෙමළ | මාර්ගෙ ෝපදේශ ග්‍රන්ථ 15 | 10 | 40 | 50 |
| 04 | පුහුණු අත්පොත් හා මාර්ගෝපදේශ ග්‍රන්ථ - සිංහල / දෙමළ | වර්ෂයකට කලාප 01 | - | - | - |
| 05 | පළාත් පාලන සගරාව - සිංහල / දෙමළ | පුස්තකාලය සඳහා කබඩ් 08 ක් මිලදී ගැනීම. | | | |
| 06 | පුස්තකාල සංවර්ධනය | | | | |
| 07 | ප්‍රජා සංවර්ධනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 01 | 01 | 50 | 43 |
| | ප.පා. පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2015 / 2016 | වාර්ෂික පාඨමාලාවකි | | | |

මූලාශ්‍රය- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

වගු අංක 35 - ප්‍රාදේශීය මට්ටමේ වැඩමුළු - පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
(2016 සිව්වන කාර්තුව දක්වා ප්‍රගතිය)

| | වැඩමුළුවේ නම | පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ප්‍රාදේශීය පුහුණු සම්බන්ධීකරණ නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන | 02 |
| 02 | පළාත් පාලන ආයතනවල අවසන් ගිණුම් සකස් කිරීමේ වැඩමුළුව | 05 |
| 03 | කණිෂ්ඨ සේවක කාර්යාභිවර්ධන හා වෘත්තීය පෞරුෂ වැඩිදියුණු කිරීමේ පුහුණු වැඩසටහන | 01 |
| 04 | පෞද්ගලික ලිපිගොනු නඩත්තුව පිළිබද පුහුණු වැඩසටහන | 01 |
| 05 | නව ආදායම් උත්පාදන මාර්ග හඳුනාගැනීම පිළිබද පුහුණු වැඩසටහන | 03 |
| 06 | පුස්තකාල ස්වයංක්‍රීයකරණය පිළිබද පුහුණු වැඩමුළුව | 02 |
| 07 | කාර්යාල ක්‍රම පිළිබද පුහුණු වැඩමුළුව - මධ්‍යම පළාත | 01 |
| 08 | පළාත් පාලන විෂයය සම්බන්ධයෙන් ජනමාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන | 01 |
| 09 | වාහන කළමනාකරණය පිළිබද දැනුවත් කිරීමේවැඩසටහන | 03 |
| 10 | පාරිභෝගික සත්කාරය හා මහජන සම්බන්ධතා පිළිබද පුහුණු වැඩසටහන | 01 |
| 11 | උතුරු පළාතේ පළාත් පාලන ආයතනවල ලේකම්වරුන් දැනුවත් කිරීමේ වැඩමුළුව | 02 |
| 12 | උතුරු මැද පළාතේ නවක ලේකම්වරුන් සඳහා ප්‍රාදේශීය සභා පනතට අමතරව පළාත් පාලනයට අදාල අනෙකුත් නීති පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන | 01 |
| 13 | කාර්යාල කාර්ය සහයක පුහුණු වැඩමුළුව | 01 |
| 14 | පළාත්පාලන ආයතන කාර්ය පටිපාටි සංග්‍රහය සකස් කිරීමේ වැඩසටහන | 01 |
| 15 | පළාත් පාලන ආයතනවල තාක්ෂණික සහකාරවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 01 |
| 16 | පළාත් පාලන ආයතනවල අධිකරණ කටයුතු පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන | 01 |
| 17 | පළාත් පාලන ආයතනවල නවක ලේකම්වරුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 02 |
| 18 | පළාත් පාලන ආයතනවල නවක ලේකම්වරුන් සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදනය පිළිබද වැඩසටහන | 01 |
| 19 | පෙර පාසැල් ගුරුවරුන්ගේ සෞන්දර්යාත්මක හැකියා වර්ධනය කිරීම සඳහා වූ පුහුණු වැඩසටහන | 02 |
| 20 | ව්‍යාපෘති කළමනාකරණය පිළිබද පුහුණු වැඩමුළුව | 01 |
| 21 | කාර්යාල කළමනාකරණය පිළිබද පුහුණු වැඩසටහන | 01 |
| 22 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන | 01 |
| 23 | පළාත් පාලන ආයතනවල රියදුරන් දැනුවත් කිරීමේ වැඩසටහන | 01 |
| 24 | ආපදා කළමනාකරණය පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන | 01 |

මූලාශ්‍රය- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

වාර්ෂික ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය - 2016

2016 අගෝස්තු11 වන දින කොළම බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැති පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව හා පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමාව හැදෑරූ පුහුණුලාභීන් 72 දෙනෙකු සඳහා ඩිප්ලෝමා ප්‍රදානය කෙරිණි.

පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය අමාත්‍ය පියංකර ජයරත්න මහතා ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයට සහභාගී වූ අවස්ථාව






පළාත් සභා හා පළාත් පාලන ගරු අමාත්‍ය ෆයිසර් මුස්තාපා මැතිතුමා වාර්ෂික සහතිකපත්‍ර ප්‍රදානෝත්සවයේදී පුහුණුලාභියෙකු වෙත සහතිකපත්‍ර ලබාදෙමින්...



පළාත් පාලන විෂයය සම්බන්ධයෙන් මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන



# 6.3.10. දේශීය ණය සහ සංවර්ධන අරමුදල

**දැක්ම**

පළාත් පාලන බල ප්‍රදේශ වල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ප්‍රධාන මූල්‍ය ආයතනය වීම මගින් මෙරට ආර්ථික හා සමාජ සංවර්ධනයට දායක වීම.

**මෙහෙවර**

ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය මූලික පහසුකම් සැපයීමට අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සපයනු ලබන තිරසාර සහ ස්වාධීන ආයතනයක් බවට පත්වීම.

**අරමුණ**

නීතියෙන් බලය ලැබී ඇති පරිදි පළාත් පාලන ආයතන වලට මහජන උපයෝගීතා සේවා පවත්වාගෙන යාම සඳහා සහනදායී පොළියකට මූල්‍ය පහසුකම් සැපයීම සහ අනුබල ලබාදීම.

**අරමුදල්**


ණය දීම සඳහා අවශ්‍ය අරමුදල් සහන පොළී ප්‍රතිශතයක් මත මධ්‍යම රජයේ වාර්ෂික අයවැයෙන් දීර්ඝ කාලීන ණය මුදලක් වශයෙන් නිකුත් කරනු ලබන අතර, ආසියානු සංවර්ධන බැංකු ණය අංක 1632 SRI (SF) සහ 2201 SRI (SF) සඳහා වන චක්‍රීය අරමුදල් ද ණය නිකුත් කිරීම සඳහා උපයෝගී වී ඇත.

**සංස්ථාපනය**

1916 අංක 22 දරණ ආඥා පනත යටතේ ආරම්භ කරන ලදුව, 1930 අංක 06, 1931 අංක 25, 1938 අංක 43, 1942 අංක 21 දරණ ආඥා පනත්, සහ 1949 අංක 29 දරණ පනත, 1974 අංක 09 දරණ නීතිය සහ 1993 අංක 24 දරණ පනත යන පනත් වලින් සංශෝධිත දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම ආයතනය 2015 වර්ෂයේ සිට පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

**කාර්යයභාරය**

පළාත් පාලන ආයතන 335 ක් සඳහා එනම් මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වලට ප්‍රාග්ධන ආයෝජන සඳහා අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සහනදායී පොළී පදනමක් මත සැපයීම මූලික කාර්යභාරය වේ.



**2016 වර්ෂයේදී ඉටුකරන ලද කාර්යයන්**

පළාත් පාලන ආයතන වෙත ණය දීම සඳහා රු.මි.800 ක් ඇස්තමේන්තුකර තිබුණි. 2016.12.31 වන දිනට අනුමත වූ මුළු ණය මුදල රු.මි.358 ක් වන අතර පළාත් පාලන ආයතන වෙත නිකුත්කර ඇති මුළු මුදල රු.මි.144 කි. මීට අමතරව අනුමත කර ඇති නමුත් නිකුත් කිරීමට ඇති මුළු ණය මුදල් වල අගය රු.මි.523 කි. (Pending Disbursement)

1. 2016 වර්ෂයේ ණය අයකිරීම සඳහා රු.මි.770 ක් ඇස්තමේන්තු කළ අතර 2016 තුන්වන කාර්තුව අවසන් වන විට රු.මි.490 ක මුදලක් අයකරගෙන ඇත. එය ප්‍රතිශතයක් වශයෙන් ගත්කල 85% ක් වේ.
2. ආයතනික හැකියාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිකිරීම සඳහා NELSIP ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන වෙන්කර ඇති අතර ඒ තුළින් මානව සම්පත් සංවර්ධනය ක් සිදුකිරීම.

වගු අංක 36 - ව්‍යාපෘති අනුව පොළී ප්‍රතිශත-දේශීය ණය හා සංවර්ධන අරමුදල

| ව්‍යාපෘති වර්ගය | පොළී ප්‍රතිශතය (වාර්ෂික) (%) |
|---|---|
| අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති | 5.5 |
| ජල යෝජනා ක්‍රම | 7.0 |
| සනීපාරක්ෂක ව්‍යාපෘති | 7.0 |
| ග්‍රාමීය මාර්ග සංවර්ධනය | 6.0 |
| පළාත් පාලන ආයතනවලට අවශ්‍ය කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම | 7.0 |
| ආදාහනාගාර ඉදිකිරීම | 6.5 |
| යන්ත්‍රෝපකරණ මිලදීගැනීම | 9.0 |
| සතිපොළ ඉදිකිරීම සහ සංවර්ධනය කිරීම | 7.0 |
| දර්ශණීය සම්පත් සංරක්ෂණය සහ සංවර්ධනය | 9.0 |
| සභා බල ප්‍රදේශයට අත්‍යාවශ්‍ය වෙනත් ආදායම් උත්පාදක ව්‍යාපෘති | 9.0 |

මූලාශ්‍රය- දේශීය ණය සහ සංවර්ධන අරමුදල

වගු අංක 37 - භාණ්ඩාගාර ණය ගෙවීම්- දේශීය ණය සහ සංවර්ධන අරමුදල

| Year | UDLIHP | LLDF | LGIIP | PCDP | Total |
|---|---|---|---|---|---|
| 2013 | 189,809,425.54 | 43,179,304.39 | 35,651,957.00 | 6,898,248.92 | 275,538,935.85 |
| 2014 | 372,212,440.68 | 41,217,833.91 | 35,515,308.00 | 9,000,000.00 | 457,945,582.59 |
| 2015 | 186,134,257.63 | 39,127,175.92 | 35,515,308.32 | 6,577,623.96 | 267,354,365.83 |
| 2016 | 146,425,590.12 | 37,206,205.35 | 37,209,163.80 | 8,844,934.02 | 229,685,893.17 |
| **Total** | **894,581,713.97** | **160,730,519.57** | **143,891,737.12** | **31,320,806.9** | **1,230,524,777.44** |

මූලාශ්‍රය- දේශීය ණය සහ සංවර්ධන අරමුදල

UDLIHP - නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය

PCDP - බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය

LGIIP - පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

LL&DF - දේශීය ණය සහ සංවර්ධන අරමුදල

| වගු අංක 38 - ණය අයකිරීම සහ භාණ්ඩාගරයට ගෙවීම්- දේශීය ණය සහ සංවර්ධන අරමුදල | | |
|---|---|---|
| වර්ෂය | අයකිරීම් (රු.) | භාණ්ඩාගාරයට ගෙවීම් (රු.) |
| 2013 | 578,172,374.00 | 275,538,935.85 |
| 2014 | 517,502,422.00 | 457,945,582.59 |
| 2015 | 593,313,752.00 | 267,354,365.83 |
| 2016 | 365,202,226.00 | 229,685,893.17 |

මූලාශ්‍රය- දේශීය ණය සහ සංවර්ධන අරමුදල

